තිරසර සංවර්ධනය සඳහා බලශක්තිය...

(*ENERGY FOR SUSTAINABLE DEVELOPMENT*)

R.M.A.K.Kumari ***H.M.D.N.C.Herath***

D.M.K.M.Dissanayake

K.K.M.S.K.Wijesinghe ***N.W.M.S.Nawarathna***

තිරසර සංවර්ධනය සඳහා

බලශක්තිය....

(Energy For Sustainable Development)

ආර්.එම්.ඒ.කේ. කුමාරි
එච්.එම්.ඩී.එන්.සී.හේරත්
එන්.ඩබ්ලිව්.එම්.එස්.නවරත්න
ඩී.එම්.කේ.එම්.දිසානායක
කේ.කේ.එම්.එස්.කේ.විජේසිංහ

"තිරසර සංවර්ධනය සඳහා බලශක්තිය...."

ආර්.එම්.ඒ.කේ. කුමාරි එච්.එම්.ඩී.එන්.සී.හේරත්

එන්.ඩබ්ලිව්.එම්.එස්.නවරත්න ඩී.එම්.කේ.එම්.දිසානායක

කේ.කේ.එම්.එස්.කේ.විජේසිංහ

ISBN 978 – 624 - 208 – 918 - 8

(සියලු ම හිමිකම් ඇවිරිණි.)

ප්‍රකාශනය -: 2026/05/10

පිදුම

විද්‍යාව, පරිසරය එකට එක් කරනු වස්,

අනාගතයට හිතැති පරිසරයකට මග පාදන

මෙවැනි හරිත සංකල්පයන් ඉදිරියට ගෙන යනු සඳහා

ඇප කැපව පර්යේෂණයෙහි නියුතු,

නියැලෙන්නට උත්සාහ දරන,

නව දැනුම සොයායන්නට, උත්සුකවන ඔබටත්,

මෙම කෘතිය සම්පූර්ණ කර,

මෙසේ එළි දැක්වීමට,

නන් අයුරින් සහය දුන් සැමට,

මෙම කෘතිය ,

ආදරයෙන් සහ ගෞරවයෙන් ,

පුද කර සිටිමු.....

පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සුදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මුලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි. මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පුජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වු හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මුලික අරමුණයි. මේ සඳහා නිර්මානකරණයෙන් දායක වු පාසල් දරුවන් මගපෙන්වු ගුරුභවතුන් ඇතුලු සැමට ස්තුතිය පුදකරමු.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
2026-05-10

සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා හාරිකාව විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දැල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව
2026.05.10

අන්තර්ගතය හඳුනා ගැනීමට-:

මෙම පරීක්ෂණ සැලසුමේ, යෝජනා ක්‍රියාවලිය පළමුව ද, පරීක්ෂණ හා සමීක්ෂණ වාර්තාව එයට අදාළ පටුන සමඟ දෙවනු ව ද දක්වා ඇත.

Energy For Sustainable Development

School / Society -: Research Unit Of Mahamaya Girls' College,Kandy

Teacher in charge -: Mrs.Indrani Siyambalagahakotuwa

Team members -: R.M. Amali Kaushalya Kumari

H.M.D.N. Chamodi Herath

K.K.M. Sarani Kavindi Wijesinghe

N. W.M. Semini Nawarathna

D.M.K.M. Dissanayake

01.සමීක්ෂණයේ මාතෘකාව (The Topic of the Research)

- තිරසාර සංවර්ධනය සඳහා බලශක්තිය
- බලශක්ති සංකල්ප පදනම් කරගත් නවීන නගර සැලැස්ම

නාගරික ප්‍රදේශ තුළදී බලශක්තිය නවෝත්පාදනය මෙන්ම සම්පත් කළමනාකරණයද ගැටලු සහගතව පැවතීම සුලබ කරුණක් බවට පත්ව ඇති වත්මන් සමාජය තුළ පවතින මෙම ගැටලු නිරාකරණය පෙරදැරිව වඩාත් ඵලදායී මෙන්ම බලශක්ති සුරක්ෂිත කිරීම හා තිරසාර සංවර්ධනයට ගැලපෙන නව නගර සංකල්පයක් මින් ඉදිරිපත් කෙරේ.

02. හැඳින්වීම (The Introduction)

වර්තමාන ශ්‍රී ලංකාව තුළ දැඩි අර්බුදයක්ව පවතින බලශක්ති අර්බුදය හුදෙක් ආර්ථික මට්ටම පමණක්ම බලපෑමෙන් ඇති වූවක් නොවේ. මෙය අප සියලු දෙනාටම එක්ව විසඳුම් ලබාගත හැකි ගැටලුවක් ලෙස පළමුව උපකල්පනයට එළඹිය යුතු වේ.

ගැටලුව දෙස විමසා බලන විට එයට බලපෑ හේතුන් ලෙස දුර්වල සම්පත් කළමනාකරණය, නව බලශක්ති භාවිතයට නැඹුරු වීම මෙන්ම ඒවා පිළිබඳව සමාජය තුළට නිසි දැනුවත් කිරීමක් ගෙනයාමට නොහැකි වීම මෙන්ම සම්පත් වල තිරසාර භාවිතය පිළිබඳව එතරම් සැලකිය යුතු අවධානයක් නොදීම දැක්විය හැකිය. එසේම ලාංකික සමාජය මූලික වශයෙන් පරිසරය සමඟ පවතින සම්බන්ධතාව තුළ ඉන් ප්‍රයෝජන ලබා ගත්තද නැවත මිනිසුන් වශයෙන් පරිසරය වෙත යුතුකම් ඉටු කිරීමේ ප්‍රවණතාව අඩු වීමද මෙම බලශක්ති අර්බුදයට හේතු වී ඇත.

එහිදී නාගරික පරිසරය තුළදී සියලු බලශක්තීන් භාවිතයට ගැනුනද එහි නිසි කළමනාකරණයක් නොමැති බව පෙනේ. එහිදී අධික මාර්ග තදබද, අපජලය නිසිලෙස බැහැර නොකිරීම, අධිකව සිදුවන පරිසර දූෂණය මඟින් මෙම කරුණ සනාථ වේ. එසේම ලංකාවේ පවතින ප්‍රදේශීය දේශගුණික විවිධත්වය අනුව සම්පත් බෙදීයාමේ විෂමතාවයක් පැහැදිලිව දැකගත හැකිය. ඒ අනුව විවිධ ප්‍රදේශ වලට අනුව ආවේණික සම්පත්ද පවතින බව පෙනේ. ඒ අනුව මෙම බලශක්ති ගැටලුව සඳහා පිළියම් යෙදිය හැක. එසේම ප්‍රදේශීය විවධ පුනර්ජනනීය බලශක්ති වලටද අවධානය යෙදිය හැකිය.

එසේම නාගරික ප්‍රදේශ පිළිබඳ සලකන විට ඒ තුළ පවතින සංචරණ රටාව මෙම බලශක්ති අර්බුදයට යම්තාක් දුරට හේතු වී පවතී. නිදසුනක් ලෙස පවතින අධික රථවාහන තදබදය මත අධික ලෙස ඉන්ධන දහනය වීමක් සිදුවන නිසා ඉන්ධන භාවිතය අකාර්යක්ෂම වන අතර ඉන් බලශක්ති හානියක් මෙන්ම වායු දූෂණයක්ද සිදුවේ. නමුත් අපට විවිධ ආකාර වලින් මෙම තත්වය වඩා ඵලදායී ලෙස සමනය කර ගත හැක. මේ සියල්ල මඟින්ම පෙනී යන්නේ අප රට තුළ උද්ගතව පවතින මෙම බලශක්ති අර්බුද සඳහා වඩා ඵලදායී ලෙස විසඳුම් සෙවීම කළ හැකි අතරම ඒ සියල්ල මඟින් ලංකාව තිරසාර සංවර්ධන මාවතකට යොමු කළ හැකි බවත්ය.

03. සමීක්ෂණයේ අරමුණු (The Research Purpose)

1) තිරසර සංවර්ධනයක් උදෙසා බලශක්තිය ආරක්ෂා කර ගැනීමට යොදාගත හැකි සම්පත් පිළිබඳ ප්‍රාදේශීය මට්ටමින් අධ්‍යයනය කිරීම.
2) සැමටම අනුගමනය කළ හැකි (සහනදායී වැයක් යටතේ) බලශක්ති ආරක්ෂණ ක්‍රම අධ්‍යයනය කිරීම.
3) මෙරට හා ලොව දැනට භාවිතා වන ප්‍රසිද්ධ හා අප්‍රසිද්ධ බලශක්ති ආරක්ෂණ ක්‍රම අධ්‍යයනය කිරීම.
4) පුනර්ජනනීය බලශක්තිය භාවිතයේදී හා බලශක්ති ආරක්ෂණ ක්‍රම අනුගමනයේදී සාමාන්‍ය පුරවැසියාට ඇතිවන ගැටලු අධ්‍යයනය කිරීම.
5) බලශක්ති ආරක්ෂණ/පුනර්ජනන ක්‍රම පිළිබඳ ලොව දැනට ඉදිරිපත් වී ඇති ප්‍රසිද්ධ හා අප්‍රසිද්ධ සමීක්ෂණ හා පර්යේෂණ කිහිපයක් අධ්‍යයනය කිරීම.

04. උපකල්පන (Hypothesis)

නිවාස සැලසුම්

විවිධාකාරයේ නිවාස සැලසුම් අද වන විට සමාජය තුළ ප්‍රචලිත වෙමින් පවතී. ඒ අතර "Box house concept" යන සංකල්පය ලංකාව වැනි සර්ම කලාපීය රටකට මනාව ගැලපේ. එහිදී සිදු වන්නේ ඉතා අඩු ඉඩක් තුළ මනා ඉඩ කඩකින් වඩාත් ඵලදායීව නිවස ඇතුළත ඉඩ කළමනාකරණය කරමින් වඩා හොඳින් වාතාශ්‍රය මෙන්ම ස්වභාවිකව ලැබෙන හිරු එළියද වඩා ඵලදායීව යොදා ගනිමින් ස්වභාවිකව ආලෝකකරණය කිරීමද සිදු කළ හැක. එසේම නිවාසය සෑදීමට භාවිතා වන ඉඩකඩ ඉතා අල්ප නිසා ඉතිරි වන භූමි ප්‍රදේශය ජෛව සම්පත් කළමනාකරණයට යොදා ගත හැක. එනම් ගෙවතු සකස් කිරීම වැනි උපායයන් ක්‍රියාත්මක කළ හැක. එහිදී ඒ සඳහා අවශ්‍ය පොහොර සකසා ගැනීමට ද ඉඩ සැලසෙන බැවින් මෙම නිවාස සංකල්පය බලශක්තිය තිරසර භාවිතයට මෙන්ම දැඩිව උද්ගත වන අපද්‍රව්‍ය කළමනාකරණ ගැටලුවටද විසඳුම් ලබා දීමට උත්සාහ ගනී. එසේම ඉඩ අවම ප්‍රදේශයක් ලෙස නාගරික ප්‍රදේශ වල ඉදිවන තට්ටු නිවාස සංකීර්ණ සඳහා ද මෙම සංකල්පය පහසුවෙන් යොදා ගත හැකි නිසා නාගරිකව පවතින සම්පත් උපරිමව කළමනාකරණය කළ හැක.

නව ප්‍රවාහන සැලසුම්

නාගරිකව පවතින දෛනික සංචරණ රටාව දෙස බලන විට උදෑසන හා දහවල් කාලයත් ප.ව.4.00න් පමණ පසු සවස 7.00 පමණ වනතෙක් අධිකව ජන සංචරණයක් දැකිය හැකියි. එහිදී පාසල්, කාර්යාල වල වැඩ කටයුතු ආරම්භයත් අවසානයත් ඇතැම් අවස්ථා වලදී මෙම ආයතන වල පිහිටීමත් නිසා දැඩි මාර්ග තදබදයක් ඇති කරයි. මෙම තදබදය තුළදී දහනය වන ෆොසිල ඉන්දන ද බලශක්ති හානියකි. එසේම මෙම දහනයෙන් නිකුත් වන CO_2 , NO_2 වැනි වායූන් මඟින් දිගු කාලීනව දේශගුණික විපර්යාස වලට හේතු වී චක්‍රාකාරයෙන් ජලය වැනි ස්වභාවික බලශක්තීන්ට ගැටලු ඇති කරයි.

එමනිසා මීට පිළියම් ලෙස දිගුකාලීන විසඳුම් වශයෙන් නවීන මාර්ග ප්‍රවාහන පද්ධතියක් ඉදි කිරීම සංචරණ වේලාවල් වලට වඩා ව්‍යාප්ත වූ වේලාවන් බවට පත්කර ගැනීමට කටයුතු සැලසීම ආදිය සිදුකල හැක. නමුත් මෙම අවස්ථාවේ දී ගත හැකි ක්ෂණික පියවරයන් ලෙස මගී ජනතාවට වඩා සුවපහසු පොදු ප්‍රවාහන සේවාවන් සැපයීම හා ඔවුන්ට මෙම බලශක්ති හානිය පිළිබඳ දැනුමක් එකතු කරලීම ගත හැකි අතර පාසල් හා කාර්යාල වලට වෙන් කරන ලද ප්‍රවාහන සේවා සැපයීම කළ හැක. ඉන් අධික වශයෙන් රථවාහන මාර්ග වලට පිවිසීම නැවතී මාර්ග තදබදය අවම කාර්යක්ෂම ප්‍රවාහනයක් ඇති කිරීමෙන් බලශක්තිය තිරසරව භාවිතා කළ හැක. ඉන් ආර්ථික වශයෙන් ද මනා ඉතිරියක් කළ හැක.

පුනර්ජනනීය බලශක්තිය භාවිතය

වඩාත් ප්‍රචලිත පුනර්ජනනීය බලශක්තීන් ලෙස ජලය, හිරුඑළිය හඳුන්වා දිය හැක. එහිදී ලංකාව තුළ වැඩි වශයෙන්ම භාවිතා වන්නේ ජලයයි. බලශක්තියක් ලෙස විදුලි ජනනයේදී ජල හිඟය දැඩි ලෙස මෙම බලශක්ති අර්බුදයට බලපා ඇත. නමුත් ලංකාවේ පවතින දේශගුණික තත්වයන් විවිධාකාර නිසා අපට මෙම බලශක්ති ක්‍රමානුකූලව හසුරුවා ගැනීමෙන් වඩා ඵලදායීව බලශක්තිය තිරසර සංවර්ධනයට දායක කරගත හැක.

එනම් ලංකාව සර්ම කලාපීය රටක් වුවද ලැබෙන වාර්ෂික වර්ෂාපතනය වැඩි නිසා තවදුරටත් ජලාශ ආදිය ඉදිකිරීමටත් වැසි ජල ටැංකි පද්ධති පවත්වා ගෙන යාමත් කළ හැකිය. එසේ අපජලය නැවත පිරිපහදු කිරීමේ නවීන තාක්ෂණික ක්‍රම යොදාගෙන නැවතත් පිරිසිදු තත්වයේ ජලය ගෙන වෙනත් කටයුතු වලට භාවිතයද කළ හැක. එසේම ලංකාවට ලැබෙන හිරුඑළිය අනුව සූර්ය පැනල භාවිතය වඩා හොඳින් ව්‍යාප්ත කළ හැකිය. ඒවායේ මිළ ගණන් අධික වුවද වර්තමානය වන විට ආදේශක අමුද්‍රව්‍ය මඟින් එය සහනදායී මිලට ලබා ගැනීමට හැකිවන තරම් දියුණු කිරීමට හැකියාව ලැබී ඇත. ඉන් ස්වාධීන නිවාස බලශක්ති ඒකක ලෙස බලශක්ති කළමනාකරණයක් සිදු කළ හැක. එසේම ලංකාව වටා පවතින මුහුදු ආශ්‍රිත ප්‍රදේශ මෙන්ම වියළි කලාපිකව පවතින සුළං තත්ව භාවිතයට ගනිමින් සුළං විදුලි බලාගාර තවදුරටත් වර්ධනය කළ හැක. ඒ අනුව ලංකාව පුරාවටම විවිධාකාර බලශක්ති ප්‍රභව වලින් නිපදවා ගන්නා ශක්තීන් එක්කොට වඩා තිරසර වූ බලශක්ති පාලනයක් කළ හැක. එහිදී නවීන ක්‍රමවේද ඇසුරින් හයිඩ්‍රජන් බලශක්තිය මුහුදු ජලය ඇසුරින් නිපදවීමට වර්තමානයේ විද්‍යාඥයන් සමත්ව පවතී. එම තාක්ෂණය ලංකාවට ගෙන ආ විට එයද වඩාත් ඵලදායීව තිරසර සංවර්ධනයට හේතුවේ.

අපද්‍රව්‍ය කළමනාකරණය

බලශක්ති භාවිතයේදී අතුරු ඵල ලෙස නිපදවන ද්‍රව්‍ය අපද්‍රව්‍ය වන අතර අපද්‍රව්‍ය අවම වන සේ භාවිතා කිරීම බලශක්ති කාර්යක්ෂමතාව ඉහල නංවයි. එහිදී විශාල වශයෙන් කාබනික අපද්‍රව්‍ය ඉවත දැමීමක් සිදුවේ. මේ අනුව පාරිසරිකවද දැඩි තර්ජනයක් එල්ල කරනු ලබන මෙම ගැටලුව ජීව විද්‍යාත්මකව විසඳුම් ලබා දිය හැකි ඒවා වේ. ඉවතලන ජීවී කාබනික අපද්‍රව්‍ය නිර්වායු ජීර්ණයට ලක් කර මීතේන් වැනි විවිධ වායු වර්ග මඟින් ජීව වායුව නිපදවා ගැනීම මඟින් L.P Gas වැනි බලශක්ති භාවිතය අවම කළ හැකි අතර නාගරික ප්‍රදේශවල අනාවශ්‍ය ලෙස අපද්‍රව්‍ය එකලස් වීමද අවම වී යයි. එසේම මේ සඳහා සත්ත්ව අපද්‍රව්‍ය එක්කළ හැකි වීම මඟින් ගොවිපළ

ආශ්‍රිතව ඇතිවන පරිසර හානිය අවම කළ හැකි වීමද යහපත් නාගරික ප්‍රදේශ ගොඩනැගීමට හැකිවේ.

එසේම නවීනව හඳුන්වා දෙන හූ සනීපාරක්ෂක පිරවුමද ඉහත අයුරින්ම ජීව වායු නිපදවා ගැනීමටත් ඉඩම් හිඟ වීම හා අපද්‍රව්‍ය කළමනාකරණයටත් ඉඩ සලසා දේ. ඉන් අපද්‍රව්‍ය දහනයට වැය වන බලශක්තිය ඉතිරි කරමින් නව බලශක්ති ප්‍රභවයක් ලෙස ක්‍රියා කරයි.

එසේම ස්වාභාවික සම්පත් අනූන ලංකාව තුළ තෙල් ප්‍රභේද මඟින් භාවිතයෙන් පසු ඉවතලන පොල්කටුද වඩා ප්‍රචලිත දාහපද්‍රව්‍යක් ලෙස සමාජයට හඳුන්වා දීම සිදු කළහොත් එයද ඉතා හොඳ කාර්යක්ෂම ඉන්ධනයක් ලෙස භාවිතා කළ හැකි වේ. ඉන් ගල් අඟුරු වැනි ද්‍රව්‍ය ආනයනයට වැය වන මුදල් අවම කරගත හැකිවේ.

මෙම සංකල්පයන් සේම හරිත සංකල්පය (Green Concept) පදනම් කරගත් වඩාත් පහසුකම් සහිත නව නගර සැලසුමක් තුළ නිර්මාණය වන්නේ ඉතා කාර්යක්ෂම හා වඩාත් පරිසර හිතකාමී මෙන්ම තිරසර සංවර්ධනය කෙරේ නැඹුරුවන බලශක්ති භාවිතය සමඟ ගොඩනැගෙන නාගරික ජනාවාසයන් වේ.

05. සමීක්ෂණයේදී අනුගමනය කළ යුතු ආචාර ධර්ම/ විධි ක්‍රම (Research Ethics)

1) මෙහිදීතොරතුරුලබාදෙන ආයතන හා පුද්ගලයන්ගේ අනන්‍යතාව ආරක්ෂා වන පරිදි තොරතුරු ලබා ගැනීමට අපේක්ෂා කරයි.
2) අප විසින් ආදර්ශනයට ගනු ලබන වෙනස් හිමිකරුවකුගේ සමීක්ෂණ හෝ පර්යේෂණ දත්ත හා වාර්තා පිළිබඳ මුල් හිමිකරුගේ අයිතිය ආරක්ෂා වන පරිදි අවශ්‍ය තොරතුරු සඳහන් කරයි.
3) කිසිඳු පිරිසක්/ ආයතනයක් ප්‍රවර්ධනයට හෝ විවේචනය අදහස් නොකරයි.
4) තොරතුරු ලබාගත් මූලාශ්‍රයන්ද හැකි පරිදි සාක්ෂි ඉදිරිපත් කරමින් අවසන් වාර්තාවට ඇතුළත් කිරීමට අපේක්ෂා කරයි.

06. සමීක්ෂණයේ වැදගත්කම (Importance of the Research)

1) පුනර්ජනනීය බලශක්තිය හා බලශක්ති ආරක්ෂණ ක්‍රම පිළිබඳ දැනුම ලැබීම.
2) සාමාන්‍ය පුරවැසියාගේ දායකත්වය බලශක්ති ආරක්ෂණයට යොදාගන්නා අයුරු සාකච්ඡා වීම.
3) බලශක්ති පුනර්ජනනය සහ ආරක්ෂණය හා බැඳුණු වෙනත් සමීක්ෂණ/ පර්යේෂණ පිළිබඳ සාකච්ඡා වීම.
4) බලශක්තිය පිළිබඳ සාමාන්‍ය මහජන මතය සාකච්ඡා වීම.
5) බලශක්තිය ආරක්ෂා කිරීමට දැනට ආයතනයක්/ පුද්ගලයෙක් විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග සාකච්ඡා කිරීම හා එම ක්‍රියාමාර්ග පැසසීම.
6) කසළ කළමනාකරණය පිළිබඳවද වැදගත් නව අදහස් සමාජගත කිරීම.

07. සීමාවන් (Limitations)

1) මෙහිදීඇතැම් තොරතුරු දුරකතන හෝ වෙනත් ක්‍රම මඟින් ලබා ගැනීමට සිදු වන අතර ස්ථානීය වශයෙන් පරික්ෂා කිරීමට ඇති අවස්ථා අවමය.
2) වෙනත් අයෙකුගේ සමීක්ෂණ හෝ පර්යේෂණ සොයාගැනීම් ඉදිරිපත් කිරීමේදී සෑම විටම ස්වයං අත්හදා බැලීමක් සිදු කිරීම නොහැකි වනු ඇත.
3) තොරතුරු ලබාදෙන පුද්ගලයන්/ආයතන වල අභිමතය පරිදි අනන්‍යතාව හෙළි කිරීමට වනු ඇත.
4) ඇතැම් තොරතුරු ලබා ගැනීමේදී අන්තර්ජාලයට හෝ පොත්පත් හෝ වෙනත් තොරතුරු මූලාශ්‍රයකට සීමා වීමට සිදු වනු ඇත.

08. මාතෘකා සංක්ෂිප්තය (Literature Review)

අප තෝරාගත් මාතෘකාව අනුව තිරසර සංවර්ධනය සඳහා බලශක්ති භාවිතය නාගරික පරිසරයට අනුරූපව කෙසේ විය යුතුද යන්න පිළිබඳව ලෝකයේ පිළිගත් සංකල්ප පදනම් කර ගනිමින් නව නගර සංකල්පයක් ඉදිරිපත් කිරීම සිදුවේ.

එහිදී අප මූලිකවම හඳුනාගත් ගැටලු වන්නේ විකල්ප පුනර්ජනනීය බලශක්ති භාවිතයට නැඹුරු වීම, අවම මට්ටමක පැවතීම, නිසි සම්පත් කළමනාකරණයක් සිදු නොවීම යන කරුණුයි.

මේ පිළිබඳව තොරතුරු සෙවීමේදී මූලික වශයෙන් පුවත්පත්, පොත්පත් වාර්තාවන් මෙන්ම ඇතැම් ඉදිරිපත් කළ ප්‍රශ්නාවලී සේම අප උගත් විෂය කරුණුද භාවිතයට ගැනීමට අපට සිදුවුණි. ඒ තුළින් ඉහත පවතින ගැටලු අනාවරණය වූවා සේම මෙම පර්යේෂණය ඉදිරියට කරගෙන යාමටද හැකියාව ලැබුණි. එසේම,

අවසානයේ අප විසින් යෝජිත මෙම සංකල්පයද අප යොදාගන්නා ලද්දේද උක්ත අයුරින්ම පුවත්පත්, පොත්පත් හරහා මෙන්ම අප මෙතෙක් උගත් කරුණු ඇසුරු කරගත් උපකල්පන වල සංක්ෂිප්ත හා ඵලදායීව සැකසුවකි.

මෙම ව්‍යාපෘතියඅවසානයේදීබලාපොරොත්තු වන්නේ ලංකාවේ විවිධ ප්‍රදේශවලට ගැලපෙන අයුරින් බලශක්ති තිරසරව භාවිතා කරන නව පුනර්ජනනීය බලශක්ති වලට යොමු වූ නාගරිකව සිදුවන බලශක්ති හානිය අවම වඩාත් ජීවත් වීමට සිදුවූ නව නගර ගොඩනැගීමයි.

එය නොදැනීම ලංකාව වඩාත් තිරසර සංවර්ධනයකට යොමු කිරීමට හේතුවන බව නොඅනුමානයි.

09. ක්‍රමවේදය (Page Methodology)

1) මෙමසමීක්ෂණයේදී පුනර්ජනනීය බලශක්තිය හා බලශක්ති ආරක්ෂණ ක්‍රම විවිධ ලෙස යොදාගන්නා මෙරට ආයතන කිහිපයකින් තොරතුරු ලබා ගැනීමට අපේක්ෂා කරයි.
2) පුනර්ජනනීය බලශක්තිය නිපදවීමට යොදාගන්නා ක්‍රම පිළිවෙත් හා සේවා ලබාදෙන ආයතන කිහිපයක් සමඟ තොරතුරු බෙදා ගැනීමට අපේක්ෂා කරයි.

3) පුනර්ජනනීය බලශක්තිය දැනටමත් භාවිතා කරන නිවෙස් මඟින් ඒවායේ ගැටලු හා ඵලදායී බව පිළිබඳ අදහස් හා දත්ත ලබා ගැනීමට අපේක්ෂා කරයි.
4) බලශක්තිය පුනර්ජනනය හා ආරක්ෂණ ක්‍රම පිළිබඳ ඉදිරිපත් වී ඇති සමීක්ෂණ හා පර්යේෂණ අධ්‍යයනය කර ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරයි.
5) බලශක්ති හා තිරසර සංවර්ධනය පිළිබඳ මහජන මතය ප්‍රශ්නාවලියක් මඟින් විමසීමට අපේක්ෂා කරයි.

(11)කාල රාමුව																				
	September 2023				October 2023				November 2023				December 2023				January 2024			
weeks	1	2	3	4	1	2	3	4	1	2	3	4	1	2	3	4	1	2	3	4
ව්‍යාපෘති යෝජනාව සකස්කිරීම																				
ව්‍යාපෘති යෝජනාව භාරදීම හා අනුමැතිය ලබා ගැනීම																				
දත්ත රැස් කිරීම																				
දත්ත විශ්ලේෂණය හා අවසාන වාර්තාව හා සාරාංශය සකස් කිරීම																				
අවසාන වාර්තාව ඉදිරිපත් කිරීම																				

Energy For Sustainable Development

School / Society -: Research Unit Of Mahamaya Girls' College,Kandy

Teacher in charge -: Mrs.Indrani Siyambalagahakotuwa

Team members -: R.M. Amali Kaushalya Kumari

H.M.D.N.Chamodi Herath

K.K.M.Sarani Kavindi Wijesinghe

N.W.M.Semini Nawarathna

Kavindya Dissanayake

මාතෘකා පිටුව

පර්යේෂණ මාතෘකාව - තිරසර සංවර්ධනය සඳහා බලශක්තිය

(Topic) - Energy for sustainable development

පර්යේෂකයන්ගේ නම් - Kumari R.M.A.K.

(Names of researchers) Herath H.M.D.N.C.

Nawarathna N.W.M.S.

Wijesinghe K.K.M.S.K.

Dissanayake D.M.K.M.

අනුබද්ධ ආයතනය - පර්යේෂණ සංසදය,

(School) මහාමායා බාලිකා විද්‍යාලය, මහනුවර.

Research unit of

Mahamaya Girls' College, Kandy.

සාරාංශය

තිරසර සංවර්ධනය උදෙසා බලශක්තිය පිළිබඳව අප විසින් කළ සමීකරණය තුළ බල ශක්ති ආකාරත් එම ක්‍රම කාර්යක්ෂමව භාවිතයට ගත හැකි ගෘහ නිර්මාණ ආකාරත් ගැන කරුණු අධ්‍යනය සිදු කෙරුණේ ගූගල් පෝරමය (Google Form) හා වෙනත් සමාජ මාධ්‍ය මූලාශ්‍ර යොදා ගනිමිනි.

මෙහි දී වඩාත් වැදගත් සාධකයක් වූයේ අප දිවයින ම ආවරණය වන පරිදි ඉදිරිපත් කළ ගූගල් පෝරමය හරහා ලැබුණු මහජනතාවගේ අදහස් වේ. එහි දී තිරසර සංවර්ධනය පිළිබඳ පුළුල් පරාසයක් ආවරණය කරමින් ප්‍රශ්නාවලිය ඉදිරිපත් කෙරිණි.

ඉන් වැඩි ප්‍රජාවක් මෙම බල ශක්ති සංකල්ප භාවිතයට නැඹුරු වෙමින් ස්වභාවික සම්පත් කළමනාකරණයට ඉදිරිපත් වී ඇත. එහි දී ගූගල් පෝමරයට ප්‍රතිචාර ලබා දුන් ප්‍රජාවගෙන් 90.3% ක් තිරසර සංවර්ධනය ගැන දැනුමක් ලබා ඇති බවත්, ඒ දැනුම ලබා දීමට පාසල වැඩි දායකත්වයක් ලබා දී ඇති බවත්, 53.1%ක පිරිසක් තිරසර සංවර්ධනය ගැන වූ සිය දැනුම පිළිබඳ ව සෑහීමකට පත් නොවන බවත්, 76.1% ක පිරිසක් මෙරට සංවර්ධන ව්‍යාපෘති වල ඵලදායි බව ගැන සෑහීමට පත් නොවන බවත් පෙනී ගියේ ය. 77% ක පිරිසක් ඔවුන්ගේ ක්‍රම වේද වෙනස් කරමින් මෙම සංකල්පයට (තිරසර සංවර්ධනයක් උදෙසා බල ශක්තිය) එකඟ ව ක්‍රියා කිරීමට කැමති බවත් අපට පෙනී ගිය අතර 66% ක පිරිසකට ඒ සඳහා ගැටලුවක් වූයේ අදාළ ක්‍රම වලට වැය වන අධික පිරිවැය යි.

මේවා සැළකීමේ දී වඩා පහසුවෙන් මෙම සංකල්පය ඉදිරියට ගෙන යාමට පාසල් පාදක වැඩමුළු යොදා ගැනීමත්, මෙම සංකල්පය තේමා කරගත් ව්‍යාපෘති වඩා සුලභ කිරීමත්, ජනතාවගේ ආදායම් මට්ටමට උචිත ලෙස තාක්ෂණික ක්‍රම වැඩි දියුණු කිරීමටත්, ක්‍රමවේද සැකසීමත් කළ හැකි ය. මෙහි වැදගත්කම වන්නේ අඛණ්ඩ බල ශක්ති සැපයුමක් ලබා දී අනාගත බල ශක්ති අර්බුදවලට යහපත් ප්‍රතිචාර දැක්වීමටත් ශ්‍රී ලංකාවට හැකියාව ලැබීම යි.

අන්තර්ගතය

	පිටුව
මාතෘකා පිටුව	01
සාරාංශය	02
අන්තර්ගතය	03
හැඳින්වීම	04
සාහිත්‍ය සමාලෝචනය	05
ක්‍රමවේදය	06
ප්‍රතිඵල	08
සාකච්ඡාව	36
නිගමනය	51
ඇමුණුම්	53
මූලාශ්‍ර	63

හැඳින්වීම

ගැටලුව -

- බලශක්තිය / තිරසර සංවර්ධනයට දායක කර ගැනීමට මෙරට ජනතාව සතුව පවතින දැනුම/අවබෝධය/ආකල්ප කෙසේ ද?
- තිරසර සංවර්ධනය සඳහා ශ්‍රී ලංකාව තුළ භාවිතා කළ හැකි නූතන ක්‍රමවේද මොනවා ද?

අරමුණු -

- තිරසර සංවර්ධනය සඳහා බලශක්තිය නිවැරදිව භාවිතා කිරීම පිළිබඳ ව මෙරට ජනතාවගේ අවබෝධය පිළිබඳ ව අදහසක් ලබා ගැනීම.
- තිරසර සංවර්ධනය යන සංකල්පය පිළිබඳ ව ජනතාවගේ දැනුවත්භාවය පිළිබඳ කරුණු විමසීම.
- බලශක්තිය ආරක්ෂා කිරීමට ක්‍රියා මාර්ග ගැනීමට අපහසු වීමට හේතු සෙවීම.
- බල ශක්තිය අපතේ යාමට බලපාන ජනතාව විසින් එදිනෙදා ජීවිතයේ දී සිදු කරන වැරදි හා අතපසුවීම් පිළිබඳ අදහස් ලබා ගැනීම හා ලබා දීම.
- මෙවැනි සංකල්ප පිළිබඳ ව ජනතාව දක්වන අදහස් පිළිබඳ ව අදහසක් ලබා ගැනීම.
- මෙවැනි සමීක්ෂණ ව්‍යාපෘති පිළිබඳ විවිධ වයස් කාණ්ඩ දක්වන උනන්දුව පිළිබඳ ව අධ්‍යයනය කිරීම.

ක්‍රමවේද පිළිබඳ දළ විශ්ලේෂණය-

- සමීක්ෂණ යෝජනාවේ සඳහන් ක්‍රමවේදයන් යම් මට්ටමින් බැහැර වුව ද අප යොදා ගත් පරීක්ෂණ ක්‍රම වේදය සිතූ පරිදි සාර්ථක විය.
- එනම් අපට අවශ්‍ය දත්ත හා ප්‍රතිඵල ලැබිණි.

සාහිත්‍ය සමාලෝචනය

අප තෝරා ගත් මාතෘකාව අනුව තිරසර සංවර්ධනය සඳහා බලශක්ති භාවිතය නාගරික පරිසරයට අනුරූප ව කෙසේ විය යුතු ද යන්න පිළිබඳ ව ලෝකයේ පිළිගත් සංකල්ප පදනම් කර ගනිමින් නව නගර සංකල්පයක් ඉදිරිපත් කිරීම සිදු වේ.

එහි දී අප මූලික ව ම හඳුනා ගත් ගැටලු වන්නේ විකල්ප පුනර්ජනනීය බලශක්ති භාවිතයට නැඹුරු වීම අවම මට්ටමක පැවතීම, නිසි සම්පත් කළමනාකරණයක් සිදු නොවීම යන කරුණු යි.

මේ පිළිබඳ ව තොරතුරු සෙවීමේ දී මූලික වශයෙන් පුවත්පත්, පොත්පත් වාර්තාවන් මෙන් ම ඇතැම් ඉදිරිපත් කළ ප්‍රශ්නාවලිය සේ ම අප උගත් විෂය කරුණු ද භාවිතයට ගැනීමට අපට සිදුවුණි. ඒ තුළින් ඉහත පවතින ගැටලු අනාවරණය වූවා සේ ම මෙම පර්යේෂණය ඉදිරියට කරගෙන යාමට ද හැකියාව ලැබිණි. එසේම, අවසානයේ අප විසින් යෝජිත මෙම සංකල්පය ද අප යොදා ගන්නා ලද්දේ ද උක්ත අයුරින් ම පුවත්පත්, පොත්පත් හරහා මෙන් ම අප මෙතෙක් උගත් කරුණු ඇසුරු කරගත් උපකල්පන වල සංක්ෂිප්ත හා ඵලදායී ව සැකසූවකි.

මෙම ව්‍යාපෘතිය අවසානයේ දී බලාපොරොත්තු වන්නේ ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශවලට ගැළපෙන අයුරින් බලශක්ති තිරසර ව භාවිතා කරන නව පුනර්ජනනීය බලශක්ති වලට යොමු වූ නාගරික ව සිදු වන බලශක්ති හානිය අවම වඩාත් ජීවත් වීමට සුදුසු නව නගර ගොඩනැගීම යි.

එය නොදැනීම ශ්‍රී ලංකාව වඩාත් තිරසර සංවර්ධනයකට යොමු කිරීමට හේතු වන බව නොඅනුමාන යි.

ක්‍රමවේදය

තිරසර සංවර්ධනය සඳහා බල ශක්තිය යොදා ගැනීමට නම් ඒ පිළිබඳ ජනතාව සතුව දැනුම/අදහසක් තිබිය යුතු ය. එසේ ම වඩා ඵලදායී නූතන ක්‍රමවේදයන් භාවිතා කිරීමට රටක් වශයෙන් ක්‍රියා කළ යුතු ය. මේ පිළිබඳ ව දත්ත සපයා ගැනීම අපගේ සැලසුම විය.

පළමු ව කණ්ඩායම් සාමාජිකයන් එකතු වී තිරසර සංවර්ධනය හා බලශක්තිය පිළිබඳ ප්‍රශ්නාවලියක් නිර්මාණය කරන ලදී.

පසුව එය ජනයා වෙත,එනම් දත්ත සපයන්නන් වෙත ගෙන යාමට සංචාරක සමීක්ෂණ ක්‍රමවේදය වෙනුවට නූතන ලෝකයේ පහසු සමීක්ෂණ ක්‍රමවේදයක් වන (GOOGLE FORM) ගූගල් පෝමරයක් භාවිතා කරන ලදී.

පසුව එය *WHATSAPP/TEALEGRAME* වැනි විවිධ සමාජ මාධ්‍ය වෙත මුදා හරින ලදී. කණ්ඩායම් සාමාජිකයන්ට අමතරව බාහිර පුද්ගලයන්ගේ (ගුරු භවතුන් /දෙමව්පියන්/පාසල ආශ්‍රිත විවිධ සංගම්/මිතුරන්) සහය ද මීට හිමි විය.

එමඟින් අපට විවිධ වූ මට්ටම්වලින් සමස්ත දිවයිනේ ම දිස්ත්‍රික්කයන් ආවරණය කර ගැනීමට හැකි විය.

එසේ ම සපයා ගත් දත්ත නිවැරදිව වගු හා ප්‍රස්තාරගත කිරීමට දත්ත නිවැරදිව එකලස් කිරීමට හා විශ්ලේෂණය කිරීමට පහසු විය.

ඉන් පසුව අන්තර්ජාලය හා මෙරට රාජ්‍ය හා පෞද්ගලික මට්ටමින් සිදු කරන ලද සම්මත පිළිගැනීමක් සහිත සමීක්ෂණ හා තාක්ෂණ දත්ත උපයෝගී කර ගනිමින් ශ්‍රී ලංකාවේ තිරසර සංවර්ධනයට දායක කර ගත හැකි බලශක්ති ක්‍රමවේද ගැන සොයා බලන ලදී.

අප පෙර සැකසූ සමීක්ෂණ යෝජනා වලට අනුව ශ්‍රී ලංකාවේ ප්‍රසිද්ධ ආයතන, කර්මාන්තශාලා වෙත ගොස් ඔවුන් තිරසර ව බල ශක්තිය භාවිතා කරන අයුරු නිරීක්ෂණය කිරීමට සැලසුම් කළ ද එය සාර්ථක ව සිදු කිරීමට නොහැකි විය. එසේ ම තිරසර ව බලශක්ති භාවිතය පහසු කරවන නවමු සංකල්පයක් පරීක්ෂණාත්මක ව තහවුරු කරමින් හඳුන්වා දීමට

යෝජනා කළ ද කාල කළමනාකරණය හා සම්පත් සපයා ගැනීමට අපහසු වීම නිසා සැලසුම ඉටු කර ගැනීමට නොහැකි විය.

නමුදු අවසන් වාර්තාවට අවශ්‍ය දත්ත බොහෝමයක් සපයා ගැනීමට සැලසුම් කළ පරිදි හැකි විය.

ප්‍රතිඵල

- ❖ අප විසින් දත්ත ලබා ගැනීම සඳහා යොදා ගත් ගූගල් පෝමරය /Google form පහත දැක්වේ.

Energy for sustainable development

* Indicates required question

(1)තිරසර සංවර්ධනය පිළිබඳ නිර්වචනයක් ඔබේ අදහසින් සඳහන් කරන්න. (සිංහල/English) (ඔබට පිළිතුරක් දීම අපහසු නම් කෙටි ඉරක් (-) යොදන්න) *

(2)තිරසර සංවර්ධනය පිළිබඳ ඔබ යම් දැනුමක් ලබා තිබේ ද? *

Mark only one oval.

- ◯ ඔව්
- ◯ නැත

(3)දැනුවත් වී ඇත්නම් එම දැනුම ලබා ගත් ආකාරය / දැනුම ලබා දීමට මූලික වූවන්, *

Check all that apply.

- ☐ පාසල
- ☐ උසස් අධ්‍යාපන ආයතන
- ☐ කුමන හෝ රජයේ ආයතන(පාසල් හා උසස් අධ්‍යාපන ආයතන හැර)
- ☐ කුමන හෝ පෞද්ගලික ආයතන(පාසල් හා උසස් අධ්‍යාපන ආයතන හැර)
- ☐ ස්වයං අධ්‍යනය (පොත් පත්, පුවත් පත්,සඟරා,අන්තර්ජාලය භාවිතයෙන්)
- ☐ වෙනත්

(4) තිරසර සංවර්ධනයේදී ඔබ අපේක්ෂිත මූලික වාසි/ප්‍රයෝජන *

Mark only one oval.

- ආර්ථික සංවර්ධනය /ආර්ථික වාසි ලබා ගැනීමට
- පාරිසරික සුරක්ෂිතතාව
- ස්වභාවික සම්පත් කළමණාකරණය

(5) සැබැවින්ම තිරසර සංවර්ධනය ආශ්‍රිත ව ඔබේ දැනුම පිළිබඳ ඔබ සෑහීමට පත් වේද? *

Mark only one oval.

- ඔව්
- නැත
- අදහසක් නැත

(6)තිරසර සංවර්ධනය පිළිබඳ ජනතාව දැනුවත් කිරීමේ මෙරට ක්‍රියා පිළිවෙත ගැන ඔබ සෑහීමට පත් වේද? *

Mark only one oval.

- ඔව්
- නැත
- අදහසක් නැත

(7) ශ්‍රී ලංකාවේ සමස්තයක් ලෙස සංවර්ධන ව්‍යාපෘති වල ඵලදායි බව ගැන ඔබ සෑහීමට පත් වේද? *

Mark only one oval.

- ඔව්
- නැත
- අදහසක් නැත

(8) ඔබ පදිංචි පළාත *

Mark only one oval.

- උතුරු පළාත
- උතුරු මැද පළාත
- නැගෙනහිර පළාත
- වයඹ පළාත
- ඌව පළාත
- මධ්‍යම පළාත
- සබරගමුව පළාත
- බස්නාහිර පළාත
- දකුණු පළාත

(9) ඔබ පදිංචි දිස්ත්‍රික්කය *

Mark only one oval.

- කොළඹ
- කළුතර
- ගම්පහ
- මහනුවර
- මාතලේ
- නුවර එළිය
- ගාල්ල
- මාතර
- හම්බන්තොට
- කුරුණෑගල
- පුත්තලම
- අනුරාධපුර
- පොළොන්නරුව
- කෑගල්ල
- රත්නපුර
- බදුල්ල
- මොණරාගල
- ත්‍රිකුණාමලය
- අම්පාර
- මඩකලපුව
- යාපනය
- මුලතිව්
- කිළිනොච්චිය
- වව්නියා
- මන්නාරම

(10) සමස්තයක් ලෙස ඔබ පදිංචි දිස්ත්‍රික්කයට වැඩිපුර ම ලැබෙන ස්වභාවික බලශක්ති උත්පාදන ප්‍රභවය *

Mark only one oval.

- හිරු එළිය
- ජලය/වර්ෂාව
- සුළඟ

(11) පිරිවැය අඩු වන ලෙස ඔබ නිවසේ බල ශක්ති උත්පාදන ක්‍රමයක් භාවිතා කරයි ද? *
(Ex-: සූර්ය පැනල)

(12)a. එවැනි ක්‍රමයක් භාවිතය ඔබට සැබැවින්ම වාසි දායක ද? (එනම් ඒ සඳහා වියදම් කළ පිරිවැයට සාධාරණයක් වේද?) *

Mark only one oval.

- ඔව්
- නැත
- නිශ්චිත අදහසක් නැත

(12) b. එවැනි ක්‍රමයක් භාවිතයේ දී මතුවන ගැටලු වේ නම් සදහන් කරන්න. (සිංහල/English) *

(12)c. එවැනි ක්‍රමයක් දැනට භාවිතා නොකරන නමුත් ඔබට ඒ සඳහා අවශ්‍යතාවක් තිබේ ද ? *

Mark only one oval.

- ඔව්
- නැත
- Other: ______________________

(12)d. ඒ සඳහා ඇති බාධා *

Check all that apply.

- [ ] අදාළ ක්‍රමවේදයට වැය වන මුදල ඉහළ වීම
- [ ] එවැනි ක්‍රමවේද ගැන නිසි දැනුමක් නොමැති වීම
- [ ] අදාළ ක්‍රමවේද සකසා දෙන ආයතන හා ක්‍රමවේද පිළිබඳ විශ්වාස නොමැති වීම
- [ ] ස්ථිර පදිංචියක් නොමැති වීම
- [ ] වෙනත්

(13) එවැනි ක්‍රමවේදයන් ජනතාව අතර ප්‍රචලිත කිරීමට ඔබේ පවතින යෝජනා සඳහන් කරන්න.අදහසක් නැත්නම් කෙටි ඉරක්(-) යොදන්න. *

(14) ඔබේ නිවසේ දැනට පවතින සැලැස්ම අනුව ස්වභාවික හිරු එළිය/ වාතය හොඳින් ලැබේද? *

Mark only one oval.

- ඔව්
- නැත

(15) ඔබේ නිවසේ පිහිටීම/ සැලැස්ම අනුව ලැබෙන විදුලිය අපතේ යාමට හේතුවේද? *

Mark only one oval.

- ඔව්
- නැත

16)ඔබ නිවසේ විදුලිය වැය කරන පහත දෑ මොනවාද? *

Check all that apply.

- ශීතකරණයක් භාවිතය
- දිනපතා රෙදි සෝදන යන්ත්‍රය (washing machine) භාවිතය
- ජල තාපක(heater)/ ඉලෙක්ට්‍රොනික කේතල්(eletric kettle) භාවිතය
- ස්නානය සඳහා දිනපතා විදුලියෙන් උණු වතුර රත් කිරීම/hot water shower භාවිතය
- විදුලි පංකා(fan)/ වායු සමන යන්ත්‍ර(AC) භාවිතය
- සූත්‍රිකා බල්බ භාවිතය
- අනවශ්‍ය විදුලි බුබුළු දල්වා තිබීම

(17) ඔබ අයත් වයස් කාණ්ඩය *

Mark only one oval.

- අවු.10ත් - 15 ත් අතර
- අවු.15ත්- 25ත් අතර
- අවු. 25ත් -35ත් අතර
- අවු. 35ත්- 60ත් අතර
- අවු. 60ට වැඩි

(18) ඉහත අපගේ ප්‍රශ්න මාලාව ගැන ඔබ සෑහීමට පත් වේද? *

Mark only one oval.

- ඔව්
- නැත

This content is neither created nor endorsed by Google.

Google Forms

❖ එහි දී අපට ලැබුණු ප්‍රතිඵල මෙසේ ය.

Energy for sustainable development

113 responses

Publish analytics

(1)තිරසර සංවර්ධනය පිළිබඳ නිර්වචනයක් ඔබේ අදහසින් සඳහන් කරන්න. (සිංහල/English) (ඔබට පිළිතුරක් දීම අපහසු නම් කෙටි ඉරක් (-) යොදන්න)

113 responses

-

(-)

ආර්ථික, සමාජීය, පාරිසරික සංවර්ධනය තිරසර සංවර්ධනයයි

ජනගහනයට ප්‍රමාණවත් තරම් ආහාර පරිසර සුරක්ෂිත ක්‍රම මගින් නිපදවීම

අනාගත පරපුරට සපුරාගත යුතු අවශ්‍යතාවන් සපුරාගැනීමට හැකිවන ලෙස ආරක්ෂා කරමින් වර්තමාන අවශ්‍යතාවන් සපුරාගැනීම.

අනාගත පරම්පරාවට තමන්ගේ අවශ්‍යතා සපුරාලීමේ හැකියාවට හානි නොවන ලෙස වර්තමානයේ අවශ්‍යතා සපුරා ගැනීම

the sustainable development of ecosystems, aiming to balance economic growth with environmental protection + social equity.

Consuming prevailing resources while saving for the future generations also

අනාගතයේදි භාවිතය සදහා වර්තමානයේදි ස්වභාවික සම්පත් නිසි ලෙස පරිභෝජනය

රටක පවතින භෞතික හා මානව සම්පත් කළමණාකරණ කරමින් ආර්ථික සංවර්ධනය ස්ථාවර තත්ත්වයක පවත්වා ගැනීම

අනාගත පරපුරේ අවශ්‍යතා සපුරා ගැනීමට ඇති අයිතිය උල්ලංඝනය නොකරමින් වර්තමාන ප්‍රජාවගේ අවශ්‍යතා සපුරාගන්නා වූ සංවර්ධනයයි

රටේ ජාතික සංවර්ධනයත් සමඟ පරිසරය ද රැක ගැනීම.

පරිසරයට හා අනෙක් සත්ව ප්‍රජාවගේ පැවැත්මට තර්ජනයක් නොවෙන ආකාරයට සිදු කරන සංවර්ධනයක්

ඉතා හොදයි

Collecting resources from the environment causing the least amount of damage for development purposes

පරිසරයේ ඇති ස්වභාවික සම්පත් අනාගත පරපුරට සුරක්ෂිත කරමින් භාවිතා කිරීම.

අනාගත පරම්පරාවට ඉතිරි කරමින් සම්පත් කළමනාකරණ සහ සංවර්ධනය

Janayata subasiddiya salasamin sama purawasiyatama sarilana lesa sanwardnya

තිරසාර සංවර්ධනය යනු අනාගත ප්‍රජාවටද සම්පත් ඉතිරි කරමින් සරන සංවර්ධනයයි

මානව ජනගහනයට ප්‍රමාණවත් තරම් සම්පත් ප්‍රමාණයක් පරිසරයට හානි නොවන පරිදි ගොඩනැගීමේ ක්‍රියාවලියයි.

development that meets the needs of the present, without compromising the ability of future generations to meet their own needs

The goal of sustainable development is to satisfy current needs without endangering the capacity of future generations to satisfy their own.

තිරසර සංවර්ධන යනු අනාගත පරපුරට තම අවශ්‍යතා සපුරාගැනීමට හැකිඅයුරින් වත්මන් පරපුර තම අවශ්‍යතා සපුරාගැනීම.

ආර්ථික, සමාජීය, පාරිසරික සංවර්ධනයයි

ස්වාභාවික සම්පත් වැනි සම්පත් වර්තමානයේ දී මනා කළමනාකරණයකින් යුතුව භාවිතා කරමින් අනාගත පරපුරත් දායාද කිරීම

අර්තාන්විත දියුණුවක්

Pavathina sampath nisi lesa bhavitha karamin vasi laba ganeema

ස්වභාවික සම්පත් අනඅනාගතයේදී ත් ප්‍රයෝජනයට ගැනීමට හැකි අයුරින් වර්තමානයේ භාවිතා කිරීම .

පවතින සම්පත් හා ශක්තීන් මතු පරපුරට දායක සුරකිමින් පරිහරනයයි.

අනාගතය සඳහාත් සම්පත් ඉතිරි කරගනිමින් වර්තමානයේදී ඒවා ක්‍රමානුකූලව යොදාගනිමින් සංවර්ධනය ලඟා කර ගැනීම

අනාගත පරපුර සඳහා ද භාවිත කල හැකි වන පරිදි වර්තමාන පරපුර සම්පත් භාවිත කිරීම

සම්පත් ඉදිරිය අනගතයට ප්ප්‍රජොයනයට නයට ගත හැකි ඇයුරින් අරපිරිමැස්මෙන් භාවිතා කිරීම

පරිසරයෙ ඇති සම්පත් වලින් ප්‍රයෝජනය ගන්නා අතරම ඒවා අනාගතය සඳහා ද ආරක්ෂා කර ගැනීම 😶

අනාගත පරපුරටද භාවිත කිරීමට හැකි පරිදි ස්වාභාවික සම්පත් පරිභෝජනය

අනාගතයේ පරපීර වෙනුවෙනුත් සම්පත් ඉතිරි කරමින් සරිසරයට හානි අවම වන විදිහට අරපිරිමැස්මෙන් භාවිතා කිරීම

අනාගත පරපුරට ඉතිරි කරමින් සම්පත් අරපිරිමැස්මෙන් භාවිතා කිරීම.

අප භාවිතා කරන සම්පත් ,අනාගත පරපුරටත් භාවිතා කිරීමට හැකි වන සේ ඉතිරි කර භාවිතා කිරීමයි

ඉතා සාර්ථක සංවර්ධනයක්

පවතින සම්පත් අනාගත පරපුරටද බාවිතා කල හැකි වන පරිදි බාවිතය

ස්වබාවික සම්පත් හා පරිසරය අනාගත පරපුරට බාවිත කල හැකි අයුරින් පරිහරනය කිරීම හා ආරක්ශා කිරීම

සංවර්ධන උදෙසා පරිසරයේ ඇති සම්පත් භාවිතා කිරීම සහ ඒවා සුරැකීමයි.

ස්වභාවික සම්පත් කළමනාකරණ කරමින් මිනිස් අවශ්‍යතා සපුරාලමින් ආර්ථිකය හා පාරිසරික සුරක්ෂිතතාව ඇතිවන පරිදි සිදු කරන සංවර්ධනයකි

රටක පවත්නා සියලු අංශවල ආර්ථික සමාජය සංස්කෘතික වශයෙන් සිදුවන නොනවතින සංවර්ධනය

පරිසරයේ පවතින දේවල් ප්‍රයෝජන ගැනීම සහ ඒවා ආරක්ෂා කරගනිමින් අනාගත පරපුරට දායාද කිරීම.

පරිසරයේ පවත්නා සම්පත් වලින් ප්‍රයෝජනය ගන්නා අතර ම අනාගතය සඳහා ද ඒවා සුරැකීමයි.

පරිසරයෙ පවත්නා ස්වභාවික සම්පත් නිසි ලෙස කළමනාකරණය කරන අතරම අනාගත පරපුර සඳහා ද ඒවා දායාද කිරීම

ඵලදායී අරමුණක් වෙනුවෙන් පවතින සම්පත් මනා ලෙස පෙල ගැස්වීම මෙන් ම එම අරමුනේ ගුණාංග පොදු සමාජය තුළ එක් තැනකට ගෙන ඒම.

පාරිසරික සම්පත් නිසි ලෙස කලමනාකරණය කරමින් ඒවා අනාගතය උදෙසා සුරක්ෂිත කරමින් ජන ජීවිතය පහසු කරගැනීමට ඒවා යොදා ගැනීම

මානව ජනගහනයට ප්‍රමාණවත් තරම් ආහාර පරිසර සුරක්ෂිත ක්‍රම භාවිතයෙන් නිපදවීමයි..

පරිසරය ආරක්ෂා කර ගනිමින් ,මතු පරපුරට සම්පත් ඉතිරි කරමින් සංවර්ධන කටයුතුවල නියැලීමයි.

තිරසාර සංවර්ධනය යනු අනාගත පරපුරට තම අවශ්‍යතා සපුරාලීමට ඇති හැකියාවට හානියක් නොවන පරිදි වර්තමාන අවශ්‍යතා සපුරාලන සංවර්ධනයයි.

අපිට අතීත පරපුරෙන් ලැබුනු දේවල් රැකගෙන අලුතින් පැමිණෙන දැනුම හා දොවල් වලින් ප්‍රයෝජන ගෙන ඉදිරියට යාමයි

තිරසර සංවර්ධනය යනු තිරසර පරිසර කළමනාකරණය සහ සංවර්ධන කළමනාකරණය ඒකාබද්ධ කිරීමයි

සම්පත් වර්තමානයේදි භාවිතා කිරිම හා අනාගතටත් භාවිතා කල හැකි සේ ඉතිරි කිරීම

ස්වභාවික සම්පත් නිසි පරිදි කලමනාකරණය කරගනිමින් රට තුල පවතින සම්පත් තිරසාරව භාවිතා කරමින් රට සංවර්ධනය කිරීම

දේශීය සම්පත් උපරිමයෙන් යොදාගෙන දිගුකාලීන ඵලදායිතාවක් පවතින තිරවශයෙන් ම සැමට ප්‍රතිලාභ ලැලැබෙන ක්‍රියාවලියකි

පරිසර සුරක්ෂිත ක්‍රම අනුගමනයෙන් ස්වබාවික සම්පත් නිසි ලෙස කළමනාකරණය කරමින් සංවර්ධන කටයුතු සිදු කිරීම

Anagatha parapura wenuwen parisara sampath surakshitha kirima

ස්වභාවික සම්පත් කළමණාකරණය කර ජන ජීවිතය පහසු කරගැනීම

While taking advantage of the existing resources of the environment, it is also preserving them for the future.

අපට ඇති සම්පත් අනාගත පරම්පරාවටද ඉතුරු කරමින් ඒවා භාවිතයෙන් සංවර්ධන කටයුතු කිරීමයි

පවතින පම්පත් ඉදිරි පරපුරට උරුම කිරීමට හැකිවන ලෙස එම සම්පත් අරපිරිමැස්මෙන් භාවිතා කිරීම

පරිසර සුරක්ෂිතතාවය පවත්වා ගනිමින් සංවර්ධන කටයුතු සිදුකිරීම

පරිසරය අනාගතයට ආරක්ෂා කරමින් නිසි කලමනාකරණයෙන් යුතුව භාවිතය

Using resources while remaining to the next genaration

පරිසරය නිසි පරිදි කලමණාකරණය

තාක්ෂණික මෙන්ම පාරිසරික ,ආර්ථික සංවර්ධනයට සම්පත් නිසි ලෙස කලමනාකරණය

-

සම්පත් විෂමතාවයකින් තොරව සමාජයේ බෙදී ගොස් ආර්ථික සාමාජීය පාරිසරික සංවර්ධනය සිදුකිරීම

පාරිසරික සම්පත් අනාගතය උදෙසා ද ඉතිරි කර වර්තමානයේ ප්‍රයෝජන ගැනීම

පවතින සම්පත් නිවැරදිව භාවිතා කර ජන ජීවිතය වඩා පහසු කරගැනීම

ස්වභාවික සම්පත් කළමණාකරණය

පරිසරය සුරකිමින් ඉන් ප්‍රයෝජන ගැනීම

සම්පත් නිවැරදිව කලමණාකරණය

ආර්ථික සංවර්ධනය ඇතුළත්ව පාරිසරික සම්මුතීන් වලට අවනත වෙමින් ජන ජීවිතය ගොඩ නැගීමට ඒවා භාවිතය

ස්වභාවික සම්පත් කළමණාකරණය කර අනාගතය උදෙසා තිරසර භාවිතය

ආර්ථික ප්‍රයෝජන ලබාගැනීමට පරිසර හිතකාමී ලෙස ස්වභාවික සම්පත් භාවිතය

සම්පත් කළමනාකරණය මඟින් අනාගත සංවර්ධනය සැලසුම් කිරීම

පරිසරයට හානි නොකරමින් සිදු කරන සංවර්ධනය

පරිසර සුරක්ශිත ක්‍රම යොදා ගනිමින් සංවර්ධනය කිරීම

සම්පත් අපතේ නොයන පරිදි , අදි පරිභෝජනය නොකර මනා කලමනකරනයකින් යුතුව සංවර්ධන උදෙසා කටයුතු කිරීම

සංවර්ධනය උදෙසා පරිසරය විනාශ නොකිරීම

අනාගතය සදහා ස්වභාවික සම්පත් කලමනාකරනය මගින් සවර්දනයට පියනගිම

ස්වභාවික සම්පත් තිරසරව භාවිතය

ස්වභාවික ක්‍රියාවලිවලට බලනොපාන අයුරින් කරනු ලබන සංවර්ධනය

පරිසරික සම්පත් නිසි ලෙස කලමනාකරණය

Sustainability means , development that meets the needs of the present without compromising the daily ability of future generations to meet their own needs.

It is a good concept

රටක නිවැරදි පැවැත්ම. අදායම් වියදම් සමාන, නිසි භෝජන අවශ්‍යතා, නිසි පරිදි භාවිතා කළ හැකි පරිදි යටිතල පහසුකම්වැ,....වැනි දෑ වලින් පොහොසත් සහ අවශ්‍ය පහසුකම් තවත් පරම්පරා වලට ඉතිරිව සහ ඔවුනට භාවිතා කිරීමට හැකි අන්දමින් පැවැත්වගනිමින් රටක් ආර්ථික, සමාජීය,sawukyamaya හා දේශපාලනමය අතින් දියුණු වීම.

use of available resources for the development of the present while saving them for the future in an efficient , environmentally friendly manner.

(2)තිරසර සංවර්ධනය පිළිබඳ ඔබ යම් දැනුමක් ලබා තිබේ ද?

Copy

113 responses



(3)දැනුවත් වී ඇත්නම් එම දැනුම ලබා ගත් ආකාරය / දැනුම ලබා දීමට මූලික වූවන්,

Copy

113 responses



(4) තිරසර සංවර්ධනයේදී ඔබ අපේක්ෂිත මූලික වාසි/ප්‍රයෝජන

Copy

113 responses



(5) සැබැවින්ම තිරසර සංවර්ධනය ආශ්‍රිත ව ඔබේ දැනුම පිළිබඳ ඔබ සෑහීමට පත් වේද?

Copy

113 responses



(6)තිරසර සංවර්ධනය පිළිබඳ ජනතාව දැනුවත් කිරීමේ මෙරට ක්‍රියා පිළිවෙත ගැන ඔබ සෑහීමට පත් වේද?

Copy

113 responses



(7) ශ්‍රී ලංකාවේ සමස්තයක් ලෙස සංවර්ධන ව්‍යාපෘති වල ඵලදායි බව ගැන ඔබ සෑහීමට පත් වේද?

Copy

113 responses



(8) ඔබ පදිංචි පළාත

Copy

113 responses



(9) ඔබ පදිංචි දිස්ත්‍රික්කය

Copy

113 responses




113 responses
පුත්තලම
අනුරාධපුර
පොළොන්නරුව
කෑගල්ල
රත්නපුර
බදුල්ල
මොණරාගල
ත්‍රිකුණාමලය
අම්පාර
මඩකලපුව
56.6%
2/3


යාපනය
මුලතිව්
කිළිනොච්චිය
වව්නියා
මන්නාරම
56.6%
3/3

(10) සමස්තයක් ලෙස ඔබ පදිංචි දිස්ත්‍රික්කයට වැඩිපුර ම ලැබෙන ස්වභාවික බලශක්ති උත්පාදන ප්‍රභවය

Copy

113 responses



(11) පිරිවැය අඩු වන ලෙස ඔබ නිවසේ බල ශක්ති උත්පාදන ක්‍රමයක් භාවිතා කරයි ද?
(Ex-: සූර්ය පැනල)

Copy

113 responses



(12) b. එවැනි ක්‍රමයක් භාවිතයේ දී මතුවන ගැටලු වේ නම් සඳහන් කරන්න. (සිංහල/English)

113 responses

-

නැත

නිසි දැනුම නොමැති වීම

No

තාක්ෂණික ගැටළු

භාවිතා නොකරයි

Initial knowledge for maintaining isnot enough

ඒ සඳහා සුදුසු සාර්ථක ක්‍රමවේද ශ්‍රී ලංකාවේ නොවීම

දීර්ඝ කාලීනව කාලගුණයේ සිදුවන වෙනස් වීම් නිසා බල ශක්ති උත්පාදන ක්‍රියාවලිය අඩපණ වීම

–

If damaged it will cost a lot of money to rebuild

කාලගුණ වෙනස්වීම්

ප්‍රාග්ධන ගැටලු

Some process is much expensive

මූලික පිරිවැය අදිකවීම

භාවිත මා නොකරයි

වර්තමානයේ දී අධික මුදලක් වැය කිරීමට සිදුවේ

දීගු කාලීන සූර්‍යාලෝකය නොමැති බව

යෙදවිය යුතු පිරිවැය වැඩිවීම

කලමනාකරනය සඳහා මුදල් වැය වීම

ඉඩපහසුකම් සීමිතය

ඇතැම් ක්‍රමවේද සඳහා විශාල පිරි වැයක් යෑම

නඩත්තුව අපහසු වීම

බොහෝ අයට නිසි අවබෝදයක් නොමැති වීම

ඇතැම් ස්වභාවික බලශක්ති දුලබ වීම

මූලික පිරිවැය අධික වීම

වියදමට සාපේක්ෂව ලාභය තමයි , වැඩි දැනුමක් ඒ ගැන නෑ

නිසි ලෙස නඩත්තු කටයුතු කිරීමට ධනය හා කාලයක් නොමැති වීම

තවමත් අපිට ලැබිය යුතු ගාස්තු රජයෙන් ගෙවා නැත.

තාක්ශනික සහයෝගයක් නොමැති වීම

එවැනි ක්‍රමයක් බාවිත කිරීමේදි තාක්ශනික ගැටලු ඇති වීම

එවැනි දේ භාවිතය පිළිබඳ නිසි අවබෝධයක් නෑ

high cost

සූර්ය පැනල වැසි දිනවලදී භාවිතයට ගත නොහැකි වීම.

...

නිසි තාක්ෂණික ක්‍රම පිළිබඳ අවබෝධය අඩු වීම

ආරෝපණ පද්ධතිය දුර්වල වීම

Waste our money

එවැනි ක්‍රම පිළිබඳ විස්තරාත්මක දැනුවත් කිරීමක් නොමැති වීම.

වර්ෂාපතනය අනුව

පිරිවැය අධික වීම

මිලදී ගැනීමට විශාල පිරිවැයක් දැරීමට සිදුවීම

වියදම අධික වීම

නඩත්තු පිරි වැයක් දැරිමට සිදු විම

සම්පත් අවම බව

ගැටලු නෑ

Not use

අධික පිරිවැය

Money

නැත

දිගුකාලීන නඩත්තු කිරීමට ඇති අපහසුතාවය

ලබා ගැනීම තරමක් දුෂ්කර වීම

දිගුකාලීන භාවිතයේ දී මතුවන ගැටලු

තාක්ෂණික දැනුම අඩු වීම

නිසි දැනුවත් බවක් නොමැති වීම

තාක්ෂණිකව ඇතිවන ගැටලු

ආලෝකය ලබා දෙන කාලය අඩු වීම

ඒවා නඩත්තු කිරීම

තාක්ෂණික දැනුම නොමැති වීම

යම් කාලයක දී හිරු එළිය ලැබීම අවම වීම

නිසි ක්‍රමවේද ගැන අඩු අවබෝධයක් තිබීම

Technical errors.

-

ඉර එළිය ලැබෙන කාලෙට හොඳයි. නැති කාලෙටනම් පාවිච්චි කරන්න ටිකක් අමාරුයි

affordability and maintenance, lack of quality products

(12)c. එවැනි ක්‍රමයක් දැනට භාවිතා නොකරන නමුත් ඔබට ඒ සඳහා අවශ්‍යතාවක් තිබේ ද ?

Copy

113 responses



(12)d. ඒ සඳහා ඇති බාධා

Copy

113 responses



(13) එවැනි ක්‍රමවේදයන් ජනතාව අතර ප්‍රචලිත කිරීමට ඔබේ පවතින යෝජනා සඳහන් කරන්න.අදහසක් නැත්නම් කෙටි ඉරක්(-) යොදන්න.

113 responses

-

(-)

-

දැනුවත් කිරීමේ වැඩසටහන්

නව ව්‍යාපෘති මගින් ජනතාව දැනුවත් කිරීම

සූර්ය පැනල

සමාජ මාධ්‍ය හා වෙනත් ප්‍රචාරන ක්‍රම මගින් වාසි පිළිබදව දැනුවත් කිරීම

දැනුවත් කිරීමෙ වැඩසටහන් පැවත්වීම

ජනමාධ්‍ය මෙන්ම විවිධ දැන්වීම් ආකාර මගින් නිසි දැනුවත් කිරීමක් මෙන්ම පාරිභෝගිකයට ආර්ථිකව සහනදායි ක්‍රියාපිළිවලක් ඇති කිරීම

–

Organize awareness programs to inform people about the advantages.

සහන මිලටවලට උපකරණ ලබාදීම සහ මිනිසුන් දැනුවත් කිරීම

අත් පත්‍රිකා

(-)

මුළුතැන්ගේන් බැහැර කරන දිරන අපද්‍රව්‍ය වලින් ජීව වායුව නිපදවීමට.

No

Addvertisments

පහසු පිරිවැයක් සහිත උපකරණ භාවිතා

එවැනි ක්‍රමවේද පිලිබද ,එ්වායෙ වාසි පිලිබද සමාජ මාධ්‍ය තුලින් ජනතාව වැඩි වශයෙන් දැනුවත් කිරීම

දැනුවත් කිරීම හා දිරි දීම

එම සංකල්ප භාවිතා කර ආදර්ශ ව්‍යාප්රුති ඉදිරිපත් කිරීම

Giving low budget , high quality solar pannel products for normal people

රජය මැදිහත් විය යුතුයි

බැංකු මඟින් ණය ලබා දීම

--

ඉන් ලබාගත හැකි ප්‍රතිලාභ පිළිබඳ දැනුම ලබාදීම

එවැනි ක්‍රම භාවිතයට සහන ණය ආධාර වැඩ සටහන් යෙදීම

පුවත්පත් හා සමාජ මාධ්‍ය මගින් මෙම ක්‍රම භාවිතය පිළිබඳ ආදර්ශ නිර්මාණ ඉදිරිපත් කිරීම

දැනුවත් කිරීමේ වැඩමුළු

ආදර්ශ ක්‍රියාකාරකම් වලට සිසුන් ඇතුළු අනෙක් අය සහභාගිකරවීම

සහන මිලට විශ්වාසී සූර්ය පැනල ලබා දීම

දැනුවත් කිරීමේ වැඩසටහන් වැඩි කිරීම

අඩු මුදලකට අවශ්‍ය උපාංග හ දැනුම ලබාගැනිමට අවස්තාවක් ලබා දීම

ජනතාව අතර මේවා භාවිතයේ පලදායී බව ගැන තොරතුරු බෙදා හරිම

සහන මිලට සූයී පැනල බෙදාදීම

දැනුවත් කිරීමේ වැඩසටහන් පාසල් මට්ටමේ සිට පැවැත්වීම

රජය නිසි ලෙස මැදිහත් වී මාර්ගෝපදේශ ලබා දීම

දැනුවත් කිරීමේ වැඩමුළු ග්‍රාමීය මට්ටමින් පවත්වාගෙන යාම

ඉතාමත් හොදයි solar panels

by making the young people knowledgeable about global environmental issues, their place, and the suitable sustainable energy resources for particular areas of the island and empowering them to innovate, and those who often scroll social media must take the responsibility to share the reality through social media platforms . also the main youtubers in the country could educate their community.

(14) ඔබේ නිවසේ දැනට පවතින සැලැස්ම අනුව ස්වභාවික හිරු එළිය/ වාතය හොඳින් ලැබේද?

113 responses



(15) ඔබේ නිවසේ පිහිටීම/ සැලැස්ම අනුව ලැබෙන විදුලිය අපතේ යාමට හේතුවේද?

113 responses



16)ඔබ නිවසේ විදුලිය වැය කරන පහත දෑ මොනවාද?

113 responses



(17) ඔබ අයත් වයස් කාණ්ඩය

113 responses



(18) ඉහත අපගේ ප්‍රශ්න මාලාව ගැන ඔබ සෑහීමට පත් වේද?

113 responses



This content is neither created nor endorsed by Google. Report Abuse - Terms of Service - Privacy Policy

Google Forms

අප විසින් ජනගත කල ගුගල් පෝරමය සාර්ථක ව 113 දෙනෙකුට පුරවා අප වෙත එවීමට සැලසුම් කර තිබුණි. එහි දී සමස්ත ප්‍රශ්නාවලිය සිංහල භාෂාවෙන් සකසා තිබුණ ද අදහස් දැක්වීමට තිබූ ප්‍රශ්න සඳහා ඉංග්‍රීසි භාෂාව යොදා ගැනීමට ද අප අවස්ථාව ලබා දෙන ලදි.

මෙහා දී අප පළමු ප්‍රශ්නය සඳහා තිරසර සංවර්ධනය සඳහා නිර්වචනයක් ඉදිරිපත් කරන ලෙස පැවසීමු. මන්ද යමක් වචනයකට පමණක් සීමා නොවීමට නම් එහි අර්ථය දැන සිටීම වැදගත් ය.

-තිරසර සංවර්ධනයේ සම්මත අර්ථකථනය-

මූලික ව පරිසරයේ පවත්නා සම්පත් වලින් ප්‍රයෝජනය ගන්නා අතර අනාගතය සඳහා ද ඒවා ආරක්ෂා කිරීම යි.

ඉහත අර්ථකථනය සමග සසඳන විට අප වෙත සපයා තිබූ අර්ථකථනයන් හි විවිධ වෙනස්කම් තිබුණි. දත්ත සැපයූ පිරිසෙන් 45%ක් පිරිස නිවැරදි හෝ ඊට ආසන්න ව පිළිගත හැකි අර්ථකතන සපයා තිබුණි. ඉතිරි පිරිසගේ අර්ථකතනවල අන්තර්ගතය වූයේ තිරසර සංවර්ධනයෙන් ලැබෙන ප්‍රතිලාභ හෝ එහි වටිනාකම යි.

තිරසර සංවර්ධනය යන සංකල්ප මහජනයා වෙත සමීප කරවීමට වඩා උචිත ක්‍රමවේදය ලෙස අප හඳුනාගනු ගනු ලැබුවේ පාසල ය. එය අපගේ ප්‍රතිඵල ලේඛනය තහවුරු කරයි. ඉන් ආසන්න වශයෙන් 69.9% ක්‍රම තිරසර සංවර්ධනය පිළිබඳ දැනුම පාසලින් ලබා ඇත. ඒ අනුව අඩු වියදමකින් වැඩි දැනුමක් සමාජගත කිරීමට පාසල යොදා ගත හැකියි. එසේ ම එම දැනුම් බෙදා හරින වාහකයෙකු ලෙස පාසල් ශිෂ්‍ය (ළමා පරපුර) යොදා ගත හැකි යි.

එසේ ම තිරසාර සංවර්ධනය කටයුතුවල දී ජනතාව වැඩි වශයෙන් ස්වභාවික සම්පත් කළමනාකරණය කිරීම පිළිබඳ ව අවධානය යොමු කරන බව ද 4 වන පැනයට ලැබුණ ප්‍රතිචාර අනුව සිතා හැකි ය.

එසේ ම තිරසර සංවර්ධනය ආශ්‍රිතව තමන්ට ලබා ගත හැකි හෝ තමා ලබා ගත් දැනුම පිළිබඳ ජනතාවට සන්තෝෂ විය **නොහැකි** බව මෙම පරීක්ෂණයෙන් අනාවරණය විය. එසේ ම එම දැනුවත් කිරීමේ වැඩසටහන් වල කාර්යක්ෂමතාව පිළිබඳ ව ඔවුන් සෑහීමකට පත් නොවන බව පෙනී යන්නට විය. මීට අමතර ව මෙරට සංවර්ධන ක්‍රියාවලිවල ඵලදායීතාවය පිළිබඳ ඔවුන් සෑහීමකට පත් නොවේ.

අපගේ සමීක්ෂණ වැඩසටහන් සඳහා ශ්‍රී ලංකාවේ පළාත් 9 ම හා දිස්ත්‍රික්ක 25 ම සම්බන්ධ වී තිබුණි. එයින් පළාත් අතරින් මධ්‍යම පළාත ද, මහනුවර දිස්ත්‍රික්කය, දිස්ත්‍රික්ක අතරින් ද වැඩි ප්‍රතිචාර ප්‍රමාණයක් ලබා තිබුණි.

එසේ ම මෙරට ජනතාවට පහසුවෙන් යොදා ගත හැකි බලශක්ති උත්පාදන ක්‍රමය ලෙස සූර්යාලෝකය සම්බන්ධ ක්‍රම බවට මෙහි දී අනාවරණය වූවා සේ ම මහා පරිමාණ ව්‍යාපෘති සඳහා ජලය/වර්ෂාව යොදා ගත හැකි බව 10 වන පැනයට අදාළ වට ප්‍රස්තාරය අධ්‍යයනය මඟින් පෙනී යයි.(එහි වැඩි ප්‍රමාණයක් ජලය ලෙස ප්‍රතිචාර දැක්වුව ද බොහෝ විට ජලය යොදා ගත හැක්කේ මහා පරිමාණ ව්‍යාපෘති සඳහා ය. නමුත් හිරු එළිය මඟින් සූර්ය පැනල වැනි බලශක්ති උත්පාදන ප්‍රභව ක්‍රියා කරවිය හැකි ය.)

එසේම දත්ත. සැපයූ පිරිසෙන් 90% කට ආසන්න පිරිසක් ම බල ශක්ති උත්පාදන ප්‍රභවයක් භාවිතා නොකරයි. ඔවුන් ප්‍රතිචාර දැක්වීමට යොදාගත් භාෂා වචන වල වෙනස්වීම් නිසා 11 පැනයට අදාළ වගුවේ පිළිතුරු (ප්‍රතිචාර) රාශියක් දැකිය හැකියි. එසේ ම එහි තම භාවිතා කරන බලශක්ති උත්පාදන ක්‍රමය ලෙස දැව, ජෛව ඉන්ධන, ලිප දැක්වුවද ඒවා අප අපේක්ෂා කරන ක්‍රමවේද නොවූ නිසා ඔවුන ද එවැනි ක්‍රමවේදයක් භාවිතා නොකරන කුලකයට ඇතුළත් කරන ලදී.

එසේ ම විකල්ප බලශක්ති ප්‍රභව භාවිතයට 78%කට ආසන්න පිරිසකට අවශ්‍ය වුව ද ඒ සඳහා බාධා ඇති බව 12 C පැනයට ලැබුණ ප්‍රතිචාර මත පෙනී යයි. ඊට ප්‍රධාන හේතුව ආර්ථික ගැටලුව එනම් පිරිවැයක් දැරීමට ඇති අපහසුතාවය 12 d ප්‍රතිචාරයෙන් පෙනී යයි.

13 පැනයට ලැබුණ ප්‍රතිචාරයෙන් විකල්ප බලශක්ති උත්පාදන ක්‍රම සමාජගත කිරීමට ගත යුතු ක්‍රියා මාර්ග පිළිබඳ ව සමාජ විසින් ම පවසා ඇත.

එසේ ම තම නිවසේ පැවැත්ම හා පිහිටීම නිසා පිරිසකගේ නිවසේ භාවිතා වන ප්‍රධාන බලශක්ති ප්‍රභවය වන විදුලිය අපතේ යන බව 14 හා 15 යන පැනයන් හි අනාවරණය විය. සැබවින්ම එය වළක්වා ගැනීමට රටක් වශයෙන් ඉතා වාසිදායක ය.

අප වත්මන් නිවාස වල විදුලිය ප්‍රයෝජනයට ගන්නා ආකාර කීපයක් හඳුනාගෙන 16 පැනයෙන් ඒවා පිළිබඳ විමසීමක් කළෙමු .එයින් පෙනී ගියේ ජල තාපක , සූත්‍රිකා බල්බ වැනි පැරණි ක්‍රමවේද නිසාත් අනවශ්‍ය විදුලි පහන් දැල්වීම් නිසාත් නිවාස වල විදුලිය අපතේ යන බවත් ය.

මෙම සමීක්ෂණය සඳහා සහභාගී වූ පිරිසෙන් 71.7% වයස අවුරුදු 25ට අඩු පිරිස ය. එම නිසා තිරසර සංවර්ධනය පිළිබඳ මෙම වයස් කාණ්ඩයේ දැනුම වර්ධනය කිරීම වඩා ඵලදායී බව පෙනී යයි. එසේ ම වැඩිහිටි පරපුර ද මේ පිළිබඳ ව දැනුවත් කිරීම ද රටේ සම්පත් ආරක්ෂා කිරීමට වටිනා සහයක් වන බව නොඅනුමාන ය.

අවසානයේ අපේ සමීක්ෂණ ප්‍රශ්නාවලිය පිළිබඳ දත්ත සැපයූ පිරිසෙන් 95.6% සෑහීමකට පත් වන බව 18 පැනයට ලැබුණ ප්‍රතිචාර මගින් පෙනී යයි.

සැළකිය යුතුය - අපට ලබා දී තිබූ දත්ත විවිධ සංකේත වචන හා භාෂා වලින් සැපයීම නිසා ප්‍රස්තාර වගු සැලසීමේ දී එක ම කරුණ කිහිප වතාවක් ඇතුළත් කිරීමට සිදු විය. නමුත් එය සමීක්ෂණයේ ප්‍රතිඵලවල විශ්වාසදායී බව තහවුරු කිරීමට හා ජනතා අදහස් /ආකල්ප වඩා හොඳින් වටහා ගැනීමට පහසු කරවන නිසා ඒවා සංශෝධනය නොකිරීමට තීරණය කළෙමු.

යතුරු ලියනය (TYPING) මගින් පිළිතුරු සැපයීම තිබූ ස්ථානවල ඇතැම් දත්ත සපයන්නන් නොගැළපෙන /නුසුදුසු දේ සඳහන් කර තිබූ නිසා ඒවා ඉවත් කිරීමට අපට සිදු විය.

6 . සාකච්ඡාව

මෙම පරීක්ෂණය මගින් අපගේ අරමුණු වලින් එකක් වන නව නගර සංකල්පය කෙසේ විය යුතු ද යන්න පිළිබඳ ව නිසි නිගමන වලට එළඹීමට උපකාරී වේ. එහි දී මුලින් ම මෙම කටයුතු වලට සම්බන්ධ වූ ප්‍රජාව මේ පිළිබඳ ව නිසි අවබෝධයක් පවතින බවට මෙම ප්‍රතිඵල මගින් තහවුරු වුවත් ඔවුන් තව දුරටත් මෙම තිරසර සංවර්ධනය සඳහා බලශක්තිය යන්න ගැන සිය දැනුම වර්ධනය කර ගැනීමට බලාපොරොත්තු වේ. එය බෙහෙවින් සතුටුදායක බව පැවසිය යුතු වන්නේ ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වෙමින් පවතින රටවල මෙම සංකල්පය තව දුරටත් දියුණු කර භාවිතයේ යෙදීම සංවර්ධිත තත්වයට යන ගමනට වැඩි සහයක් ලබා ගත හැකි බැවිනි.

මුලින් ම එක්සත් ජාතීන්ගේ ***UN*** සංවිධානය අනුව තිරසර සංවර්ධනය යනු ***Development that meets the needs of the present without compromising the ability of the future generation to meet their own needs.*** සහ UNICEF අනුව එය 2023-2030 වසර වලට නිර්මාණය කල ප්‍රතිපත්තිය තුළ ගැළපෙන්නේ ***galvenizes a global commitmemnt to ensure a sustainable word and to protect the most impact of a changing climate and degrading environment*** යන්න යි. ඒ අනුව ඉතාමත් පැහැදිලි වන්නේ සම්පත් අනාගත පරම්පරාව සඳහා මනා කළමනාකාරීත්වයෙන් යුතු ව භාවිතා කළ යුතු ය. යන්න යි. අපගේ පරීක්ෂණය අනුව මේ බව වැඩි දෙනෙක් අවබෝධ කර ගත් බව පැහැදිලි වේ.

තවද අපට මෙම පරීක්ෂණය තුළින් පැහැදිලි වන තවත් කාරණයක් වන්නේ බොහෝ දෙනා 57.3% ක් පමණ තම තිරසර සංවර්ධනය පිළිබඳ ව දැනුම වර්ධනය කර ගැනීමට කැමැත්තෙන් සිටින බවයි. එහි දී මෙයට සහභාගී වූ ප්‍රජාවන් සිය පාසල් අවධිය තුළ දැනුම

ලබා ඇති අතර අනෙක් ක්‍රම වලට යොමු වී ඇත්තේ ඉතා සුළු ප්‍රජාවකි .එබැවින් මෙහි දී අපිට තීරණය කිරීමට සිදු වන්නේ මූලික ව ම අපගේ නගර සංකල්ප හා බලශක්ති සංකල්ප ඉදිරිපත් කිරීමට පෙර ඒ පිළිබඳ ව දැනුම ප්‍රජාව වෙත නිවැරදිව ලැබෙන සේ සම්ප්‍රේෂණය කිරීමයි. පාසල් මට්ටමින් ගත් විට අපට එදිනෙදා විෂය නිර්දේශයන් තුළට ඇතුළත් කිරීම සේ ම වර්තමානය වන විට රජය විසින් ගෙන යන රාජ්‍ය හා පෞද්ගලික ආයතන වලට මෙම සූර්ය පැනල වැනි විකල්ප බලශක්ති යෙදීම පාසල් මට්ටමට වැඩි නැඹුරුවක් සහිත ව සිදු කිරීම මෙන් ම පාසල් තුළ අඩු ම තරමින් එවැනි බලශක්ති ක්‍රම වල ආකෘති පවත්වාගෙන යෑම මෙන් ම ලෝකයේ මෙවැනි ක්‍රම භාවිතා කරමින් භාවිතා කරන ප්‍රායෝගික නව නිර්මාණ කෙරෙහි සිසුන්ගේ අවධානය යොමු කිරීමට සිසුන්ට සිදු කල හැකි ය. එසේ ම වර්තමානය තුළ ඉතා පහසුවෙන් උක්ත හුවමාරුව සමාජ මාධ්‍ය භාවිතයෙන් සිදු කල හැකි බැවින් එමගින් වාර්තා චිත්‍රපට හා විවිධ ලිපි අඩංගු කර දැක්වීම සිදු කල හැකි ය. එසේ ම මෙවැනි සංකල්ප භාවිතා වීම පිළිබඳ ව වැඩසටහන්, රූපවාහිනී මෙන් ම **Youtube** නාලිකා ඔස්සේ ද ඉදිරිපත් කළ හැකි ය.එසේ ජන ගත කළ රූපවාහිනී වැඩසටහන් මාලාවක් ලෙස ජපන් රජය විසින් ශ්‍රී ලංකා රූපවාහිනි සංස්ථාව වෙත ලබා දුන් **NHK** වාර්තා වැඩසටහන් පෙළ පෙන්වා දිය හැකි ය.

එසේ ම ලංකාව තුළ බොහෝ ප්‍රජාව දැනට මෙම ක්‍රම භාවිතා නොකළත් එවැනි දේ කිරීමට කැමැත්ත පළ කර ඇත. නමුත් බොහෝ දුරට එයට බාධා කොට ඇත්තේ වැය වන අධික වියදමයි.(66% පිරිසක්) එසේම ගුණාත්මක නිර්මාණ ඉදිරිපත් නොවීමත් එය දිගු කාලීන භාවිතයේ දී ඇතිවන ගැටලු නිරාකරණ ක්‍රමයේ පවතින දුර්වල භාවයක් ජනතාව මෙම වටිනා ව්‍යාපෘති වලින් ඈත් වීමට හේතු වී ඇත. එහි දී රජය මැදිහත් වීම මගින් මෙවැනි ව්‍යාපෘති වලට ඇගයීම් ලබා දීම, ඔවුනට ඉදිරියට ඒමට සහනාධාර ණය පහසුකම් ලබා දීම, මිල අඩු ගුණාත්මක නිර්මාණ නිපදවීමටත් නව බලශක්ති පහසුකම් සෙවීමටත් විද්‍යාඥ ප්‍රජාව ඇතුළු පිරිස දිරිමත් කිරීමත් සිදු කළ යුතු ව ඇත. එසේ ම මෙම නිර්මාණ වලට ඉතා පහසුවෙන් වෙළඳ පොළ තුලට පැමිණීමට ඉඩ අවකාශ ලබා දීමත් සිදු කළ යුතු ව ඇත. එසේ ම ඉදිරිපත් ව තිබූ අනෙකුත් අදහස් අතර මෙම විකල්ප බලශක්ති ප්‍රභව පිළිබඳ

අධ්‍යයනයටත් ඒවා භාවිතය සිදු කරන නිවැරදි ආකාරයටත් ඉගෙනීමටත් ආදර්ශ නගරයක් ඉදි කිරීම ද ඉදිරිපත් වී තිබිණි.

තව ද අපගේ නිර්මාණය පිළිබඳ ව සළකා බලන විට අපට ප්‍රධාන වශයෙන් සමාජය තුළ භාවිතා කල හැකි ප්‍රධාන ස්වභාවික සම්පත් ගැන සෙවීමේ දී හිරු එළිය වර්ෂාව සුළඟ ප්‍රධාන වේ. එසේ ම මේ වන විට ඇතැම් ප්‍රදේශ වල ජනතාව සූර්ය පැනල ,ජීව වායු ඉන්ධන හා දර වැනි ප්‍රභව භාවිතයට ද යොමු වී ඇත. එසේ ම ඔවුන් ඉන්ධන හා දර වැනි ප්‍රභව වලට ද යොමු වී ඇත. එසේ ම ඔවුන් ඉන්ධන හා දර වැනි ප්‍රභව වලට ද යොමු වී ඇත. එසේ ම ඔවුන් තම නිවාස වලට ගොඩනැගිලි ව්‍යුහය පිළිබඳ හොඳ අවධානයක් දෙමින් ස්වභාවික සම්පත් කළමනාකරණයට යොමු වී ඇති බව පෙනේ.

මේ සියල්ල අනුව වඩා හොඳ සම්පත් කළමනාකරණයට දේශගුණය පිළිබඳ ව ද අපට අවධානය යොමු කිරීමට සිදු විය. මන් ද යත් ශ්‍රී ලංකාව සර්ම කලාපීය රටක් වුවත් විවිධ දේශගුණික තත්ව පවතින බැවිනි. ඒ අනුව අප විසින් සිතියම් කිහිපයක් අධ්‍යයනයට යොදා ගන්නා ලදී. ඒවා පහතින් දැක්වේ.



ශ්‍රී ලංකාවේ දේශගුණ කලාප

ශ්‍රී ලංකාවේ දේශගුණ කලාප



ශ්‍රී ලංකාවේ සාමාන්‍ය වාර්ෂික උෂ්ණත්වය



ශ්‍රී ලංකාවේ සාමාන්‍ය වාර්ෂික වර්ෂාපතනය



ශ්‍රී ලංකාවේ වර්ෂාපතන රටා



Seasons	Southwest Monsoon	Northeast Monsoon	First Inter-monsoon	Second Inter-monsoon
Period	May-Sep	Dec-Feb	Mar-Apr	Oct-Nov
Rainfall (Average)	556 mm	479 mm	268 mm	558 mm
% of Annual Average	30%	26%	14%	30%

ශ්‍රී ලංකාවේ වර්ෂාපතන රටා



ශ්‍රී ලංකාවේ උදම් රළ වඩා හොඳින් නිර්මාණය වන ස්ථාන

සිතියම් අනුව ප්‍රධාන වශයෙන් වියළි කාළගුණයක් පුත්තලම වැනි ප්‍රදේශයත් අත්දකියි. එසේ ම නිරන්තර හොඳ වර්ෂාපතනයක් තෙත් කලාපය ආශ්‍රිතව දැකිය හැකි යි. එසේ ම අනෙක් ප්‍රදේශ වලට මෙම කාළගුණික තත්ව අඩු-වැඩි වශයෙන් දැක්විය හැකි යි. ශ්‍රී ලංකාව වටා පවතින මුහුදු තීරය වඩා හොඳින් හිරු එළිය ලැබෙන සුළං ප්‍රවාහය ඉහල යන උදම් රළ ද වැඩි වශයෙන් පවතී.

මෙම ක්‍රියා පිළිවෙළ තුළ අපගේ අදහස ක්‍රියාවට නැංවීම තරමක් අපහසු වුවත් ඉන් බලශක්ති පුනර්ජනනය ඉතා කාර්යක්ෂම ව භාවිතා කළ හැකි බව උපකල්පනය කළ හැකි වෙයි. වර්තමානය වන විට ක්‍රියාත්මක වන ජලාශ මතට සූර්ය පැනල යෙදීමේ වැඩසටහන ජලාශ වලට පමණක් සීමා නොකර ශ්‍රී ලංකාවේ මුහුදු වෙරළ ප්‍රදේශ වලට ද යෙදිය හැකි ය. එය වඩාත් විශාල ලෙස ව්‍යාප්ත කිරීමටත් ඉන් හැකියාව ලැබේ. එසේ ම වෙරළබඩ ප්‍රදේශ වලට මෙන් ම වඩා වැඩි කාලයක් හිරු එළිය ලැබෙන ප්‍රදේශ වලට සුළං බලාගාර තව දුරටත් ශක්තිමත් කිරීම හා වැඩි දියුණු කිරීම මඟින් ජාතික විදුලි බල පද්ධතියට ම එක් කළ හැකි ය. එසේ ම ඉතා සුළු ප්‍රමාණයක් වුව ද ගැඹුරු මුහුදු ප්‍රදේශ වලින් උදම් රළ මඟින් ලබා ගත හැකි විදුලිය ප්‍රමාණය ද ලබා ගත හැක.ඊට අමතරව සෑම නිවාස ඒකකයක ම ජෛව ඉන්ධන භාවිතය ද බලශක්ති හා පුනර්ජනනයටත් කාර්යක්ෂම ව ඉතා පහසුවෙන් පත් කර ගත හැකි බවටත් පත් කර ගත හැකි ය.

ජෛව ඉන්ධන මගින් අපද්‍රව්‍ය කළමනාකරණයටත් යම් විසඳුමක් ලබා දේ. එහි දී නවීන සංකල්පයක් ලෙස විද්‍යාත්මක ව පිළිගන්නා සනීපාරක්ෂක භූ පිරවුම යොදා ගන්නා ආන්තික බිම් යොදා ගන්නා නිසා ඉඩ භාවිතය ද වඩා හොඳින් සිදු වේ. එසේ ම මෙහි දී සිදු වන්නේ අපද්‍රව්‍ය පරිමාව ඉතා ම අඩු කරමින් අපද්‍රව්‍ය හොඳින් අසුරාලීම යි. ඒවා පසු ව හොඳින් ආවරණය වන පරිදි වසා දමන අතර එමගින් පසු කලක බිම් තුළ ඉදි කිරීම් වලට යොදා ගැනීමට අවස්ථාව පවතියි.

එසේ ම එමඟින් ජීව වායුව නිපදවීමක් ද සිදු වේ. එසේ ම LP වායු භාවිතය තරමක් අඩු කර ජීව වායු භාවිතයට යම් මට්ටමකින් හෝ හුරු කර එමඟින් අපද්‍රව්‍ය කළමනාකරණය කිරීමත්, රටට ආදායම් ඉතිරි කර ගැනීමත් සිදු කළ හැකි ය. එසේ ම තවත් බලශක්ති බලාගාර ලෙස

LNG බලාගාර හඳුන්වා දිය හැකි ය. මෙහි දී ස්වභාවික වායුවක් (බොහෝ විට මීතේන්) මඟින් ටර්බයින කරකවා විදුලිය ලබා ගනී. මෙම වායුව(මීතේන්) භූගත ජලාශ වල ෆොසිල ඉන්ධන ලෙස පවතී.

මෙම ක්‍රියාවලියට සමාන ක්‍රියාවලියක් මඟින් කාබනික දහන බලාගාර *(BIO MASS POWER PALNTS)* නිර්මාණය කළ හැකි ය. මෙහි දී ස්වභාවික වායු වෙනුවට අපද්‍රව්‍ය දහනයෙන් ලැබෙන වායු යොදා ගනියි. මෙය ශ්‍රී ලංකාව තුළ හොඳින් ම භාවිතා කල හැකි ආකාරයකි. මන් ද කෘෂිකාර්මික රටක් බැවින් කෘෂිකාර්මික අපද්‍රව්‍ය සත්ව අපද්‍රව්‍ය පහසුවෙන් සපයා ගත හැකි අතර මිනිස් අපද්‍රව්‍ය ,දැව හා අනෙකුත් කාබනික ද්‍රව්‍ය දහනය කර නිපදවා ගන්නා දැඩි පීඩන වාෂ්ප මඟින් ටර්බයින විදුලිය කරකවා විදුලිය උත්පාදනය කර ගනියි. කර්මාන්ත ශාලා ආශ්‍රිතව යොදා ගත හැකි තවත් විදුලි උත්පාදන ක්‍රමයක් ලෙස සම උත්පාදන විදුලි බලාගාර දැක්විය හැකි ය. එහි දී විදුලිය නිපදවීමේ දී හානි වන තාපය මගින් නැවත ලබාගෙන ජලය උණුසුම් කිරීම වැනි කාර්යයන්ට යොදා ගනියි. මෙමඟින් විදුලි මෙන් ම තාප ශක්ති දෙක ම ලබා ගත හැකි වේ. කැනඩාව තුළ ඔන්ටාරියා (Ontario) ප්‍රාන්තයේ හා ඇල්බර්ටා(Albertare) ප්‍රාන්තයේ විදුලි අවශ්‍යතාවයෙන් 65% ක් මෙමඟින් නිපදවා ගනියි. ශ්‍රී ලංකාව තුළ ද මෙම ක්‍රියාවලිය ක්‍රියාවට නැංවිය හැකි ය. මෙම විකල්ප බලශක්ති වලට යොමු වීම මගින් පහසු මිලට බල ශක්තිය බෙදා හැරීමටත් විවිධ බලශක්ති භාවිතය නිසා අඛණ්ඩ බල ශක්ති සැපයුමක් ලබා දීමට හැකියාව ලැබේ. එසේම අපද්‍රව්‍ය වුව ද නැවත නැවත රැඳී තිබීම අවම වන බැවින් පරිසර සුරක්ෂිත බව ද තහවුරු කළ හැකි ය.

එපමණක් නොව නගරාශ්‍රිත ව පවතින විදුලි පහන් හා ආලෝකකරණ උපකරණ සූර්ය පැනල මගින් ක්‍රියාත්මක වීමට හැකි අයුරින් නවීකරණයත් ඒවා ස්වයංක්‍රීය ව ක්‍රියාත්මක වීමට හැකි පද්ධතියක් මඟින් ක්‍රියා කරවීම මගින් ද විදුලිය අපතේ යාම වළකියි. එසේ ම තෙත් කලාපය තුළ අතිරික්ත ව එකතු වන ජලය ජලාශ තැනීම මගින් එක් රැස් කර ජල විදුලිය නිපදවීමට ද උත්සහයක් යෙදිය හැකි ය.එසේ ම නගරබද ප්‍රදේශ වල ඉඩකඩ ගැටලු වල දී මහල් නිවාස වඩා හොඳින් වාතාශ්‍රය ලැබෙන අයුරින් නිර්මාණය වීමේ විවිධ ගෘහ නිර්මාණ ශිල්ප ක්‍රම යොදා ගත් අතර හරිත සංකල්පය ද භාවිතයට ගනිමින් ඉහළ ම තට්ටුවේ ඇතැම් ශාක වර්ග වවා තිබීම ද වර්තමානයේ දැකිය හැකි එක් විශේෂත්වය කි. ඉන් බොහෝ

දුරට සිසිල් බවක් අපේක්ෂා කෙරේ. එසේම මෙම නගර තුළ පවතින වාහන තදබදය ජනතාව දැඩි ලෙස පීඩාවට පත් කරනවා සේ ම පරිසර දූෂණය ද ඉහළ නංවයි. එය වැළැක්වීමට පොදු ප්‍රවාහන සේවාව වහා ම ක්‍රියාත්මක කළ යුතු යි. මෙහි දී ජනතාව අපහසුවට පත් නොවන පරිදි පොදු ප්‍රවාහනය තුළ පවතින රථ වාහන සංඛ්‍යාව වැඩි දියුණු කරමින් නිවැරදි වේලාවට ධාවනයේ යෙදෙමින් නිසි පහසුකම් සැපයීම සිදු කළ යුතු ය.

මුලින් සඳහන් කළ උදම් රළ ශ්‍රී ලංකාව වටා මුහුදේ හොඳින් ව්‍යාප්ත ව පවතින්නේ මෙම රළ වලට අවශ්‍ය ද්‍රෝණි ප්‍රදේශ හොඳින් සම්බන්ධ වී ඇති බැවිනි. එමෙන් ම අඛණ්ඩ පැවැත්මත් රළවල පවතින ගුණාත්මක ප්‍රමිතීන් (රළ වල පුළුල් බව) මෙන් ම ඒවාගේ පුළුල් ව්‍යාප්තියත් යන කාරණා නිසා ඉතා ම පහසුවෙන් හා වාසිදායක ලෙස බලශක්ති ජනනයට යෙදිය හැකි ය. අවසාන වශයෙන් ශ්‍රී ලංකාව තුළ පුනර්ජනනීය බලශක්ති ය භාවිතයෙන් වඩා පරිසර හිතකාමී කාර්යක්ෂම සේවාවක් ලබා ගත හැකි බව අපි ලබා ගත් අප ඉදිරිපත් කල උපකල්පන යෝජනා හා පරීක්ෂණයේ දත්ත ගැළපීම මඟින් තහවුරු වේ.

එසේ ම නිවාස ඉදිකිරීමේ දී ස්වභාවික හිරු එළිය, වාතය නිවස තුළට ලබා ගත හැකි වන පරිදි නිවාස ඉදි කිරීමට ජනතාව දැනුවත් කළ යුතු ය. නො එසේ නම් එය අනවශ්‍ය ලෙස විදුලි බුබුළු දැල්වීම වායු සමන යන්ත්‍ර හා විදුලි පංකා භාවිතයට ඔවුනට විදුලිය වැය කිරීමට සිදු වෙයි. ඒ නිසා රැල්ලට යන නිවාස තේරීම වෙනුවට තමා ජීවත් වන ප්‍රදේශයට එම භූමියට ගැළපෙන පරිදි නිවාස ගොඩ නැඟීමට ජනතාවගේ ආකල්ප දියුණු කල යුතුයි. නිදසුනක් ලෙස ගැළපෙන තරම් වහල යෙදීම, බිත්ති උස් ව බැඳීම , දොර හා ජනෙල් සමාන්තරව යෙදීම. විනිවිද පෙනෙන වහල තහඩු භාවිතය වැනි සුළු නිර්මාණ ක්‍රියා මගින් සාමාන්‍ය ජනතාව ට ලැබෙන අනාගත වාසිය වැඩි ය.

<u>(නව ප්‍රවාහන සැලසුම්)</u>

නාගරික ව පවතින දෛනික සංචරණ රටාව දෙස බලන විට උදෑසන හා දහවල් කාලයත් ප.ව.4.00න් පමණ පසු සවස 7.00 පමණ වන තෙක් අධික ව ජන සංචරණයක් දැකිය හැකි වෙයි. එහි දී පාසල්, කාර්යාල වල වැඩ කටයුතු ආරම්භයත් අවසානයත් ඇතැම් අවස්ථා වල දී මෙම ආයතන වල පිහිටීමත් නිසා දැඩි මාර්ග තදබදයක් ඇති කරයි. මෙම තදබදය තුළ දී

දහනය වන ෆොසිල ඉන්ධන ද බලශක්ති හානියකි. එසේ ම මෙම දහනයෙන් නිකුත් වන CO_2 , NO_2 වැනි වායූන් මඟින් දිගු කාලීන ව දේශගුණික විපර්යාස වලට හේතු වී චක්‍රාකාරයෙන් ජලය වැනි ස්වභාවික බල ශක්තීන්ට ගැටලු ඇති කරයි.

එම නිසා මීට පිළියම් ලෙස දිගු කාලීන විසඳුම් වශයෙන් නවීන මාර්ග ප්‍රවාහන පද්ධතියක් ඉදි කිරීම සංචරණ වේලාවල්වලට වඩා ව්‍යාප්ත වූ වේලාවන් බවට පත්කර ගැනීමට කටයුතු සැලසීම ආදිය සිදු කළ හැක. නමුත් මෙම අවස්ථාවේ දී ගත හැකි ක්ෂණික පියවරයන් ලෙස මගී ජනතාවට වඩා සුවපහසු පොදු ප්‍රවාහන සේවාවන් සැපයීම හා ඔවුන්ට මෙම බලශක්ති හානිය පිළිබඳ දැනුමක් එකතු කරලීම ගත හැකි අතර පාසල් හා කාර්යාල වලට වෙන් කරන ලද ප්‍රවාහන සේවා සැපයීම කළ හැක. ඉන් අධික වශයෙන් රථවාහන මාර්ග වලට පිවිසීම නැවතී මාර්ග තදබදය අවම කාර්යක්ෂම ප්‍රවාහනයක් ඇති කිරීමෙන් බලශක්තිය තිරසර ව භාවිතා කළ හැක. ඉන් ආර්ථික වශයෙන් ද මනා ඉතිරියක් කළ හැක.

(අපද්‍රව්‍ය කළමනාකරණය)

බලශක්ති භාවිතයේ දී අතුරු ඵල ලෙස නිපදවන ද්‍රව්‍ය අපද්‍රව්‍ය වන අතර අපද්‍රව්‍ය අවම වන සේ භාවිතා කිරීම බලශක්ති කාර්යක්ෂමතාව ඉහළ නංවයි. එහි දී විශාල වශයෙන් කාබනික අපද්‍රව්‍ය ඉවත දැමීමක් සිදු වේ. මේ අනුව පාරිසරිකව ද දැඩි තර්ජනයක් එල්ල කරනු ලබන මෙම ගැටලුව ජීව විද්‍යාත්මකව විසඳුම් ලබා දිය හැකි ඒවා වේ. ඉවතලන ජීවී කාබනික අපද්‍රව්‍ය නිර්වායු ජීර්ණයට ලක් කර මීතේන් වැනි විවිධ වායු වර්ග මඟින් ජීව වායුව නිපදවා ගැනීම මඟින් L.P Gas වැනි බලශක්ති භාවිතය අවම කළ හැකි අතර නාගරික ප්‍රදේශවල අනවශ්‍ය ලෙස අපද්‍රව්‍ය එකලස් වීම ද අවම වී යයි. එසේම මේ සඳහා සත්ත්ව අපද්‍රව්‍ය එක් කළ හැකි වීම මඟින් ගොවිපළ ආශ්‍රිතව ඇති වන පරිසර හානිය අවම කළ හැකි වීම ද යහපත් නාගරික ප්‍රදේශ ගොඩනැඟීමට හැකි වේ.

එසේම නවීන ව හඳුන්වා දෙන භූ සනීපාරක්ෂක පිරවුම ද ඉහත අයුරින් ම ජීව වායු නිපදවා ගැනීමටත් ඉඩම් හිඟ වීම හා අපද්‍රව්‍ය කළමනාකරණයටත් ඉඩ සලසා දේ. ඉන් අපද්‍රව්‍ය දහනයට වැය වන බලශක්තිය ඉතිරි කරමින් නව බලශක්ති ප්‍රභවයක් ලෙස ක්‍රියා කරයි.

එසේ ම ස්වාභාවික සම්පත් අනූන ශ්‍රී ලංකාව තුළ ගෘහස්ථ පරිභෝජනයෙන් පසු ඉවතලන පොල්කටු ද වඩා ප්‍රචලිත දාහපද්‍රව්‍යක් ලෙස සමාජයට හඳුන්වා දීම සිදු කළහොත් එය ද ඉතා හොඳ කාර්යක්ෂම ඉන්ධනයක් ලෙස භාවිතා කළ හැකි වේ. ඉන් ගල් අඟුරු වැනි ද්‍රව්‍ය ආනයනයට වැය වන මුදල් අවම කර ගත හැකි වේ.

මෙම සංකල්පයන් සේ ම හරිත සංකල්පය (***Green Concept***) පදනම් කරගත් වඩාත් පහසුකම් සහිත නව නගර සැලසුමක් තුළ නිර්මාණය වන්නේ ඉතා කාර්යක්ෂම හා වඩාත් පරිසර හිතකාමී මෙන් ම තිරසර සංවර්ධනය කෙරේ නැඹුරු වන බලශක්ති භාවිතය සමඟ ගොඩ නැගෙන නාගරික ජනාවාසයන් වේ.

නිගමන

ප්‍රධාන සොයා ගැනීම් වල සාරාංශය-

- තිරසර සංවර්ධනය යන සංකල්පයේ ප්‍රධාන පරමාර්ථය පිළිබඳ රටේ පිරිසකගේ දැනුමක් රහිතය. නමුත් එහි ප්‍රයෝජනය / ප්‍රතිලාභ / වැදගත්කම බොහෝ පිරිසකට අවබෝධයක් ඇත.
- තිරසර සංවර්ධනය පිළිබඳ සමාජ දැනුවත්භාවය ඉහළ දැමීම සඳහා පාසල්, අධ්‍යාපනය හා පොත් පත් , අන්තර්ජාලය යොදා ගැනීම ප්‍රායෝගික ව ඵලදායී ය.
- සංවර්ධන කටයුතු වල දී ස්වභාවික සම්පත් කළමනාකරණය පිළිබඳ ව වැඩි අවධානයක් දක්වයි.
- තිරසර සංවර්ධනය පිළිබඳ තමන් සතු දැනුම පිළිබඳවත්, එම දැනුම බෙදා දීමට මෙරට ගනු ලබන ක්‍රියා මාර්ග පිළිබඳවත් මෙරට, සමස්තයක් ලෙස ක්‍රියාත්මක වන සංවර්ධන ක්‍රියාවලි වල ඵලදායිතාව ගැන ජනතාව සතුටු නොවෙයි.
- මෙරට නිවාස වල විකල්ප බලශක්ති උත්පාදන ප්‍රභවය ලෙස සූර්යාලෝකය ක්‍රියා කරන උපාංග (උදා-: සූර්ය පැනල) ලබා දීම වඩා ඵලදායී ය. නමුත් බොහෝ දෙනෙකුට ඒ සඳහා අවශ්‍යතා පැවතිය ද විවිධ බාධා ඇත.
- සහනදායී මිලට විශ්වාසනීය ක්‍රියා පිළිවෙත් හඳුන්වා දීම සහ ඒ පිළිබඳ ව සහනදායී මිලට විශ්වසනීය ක්‍රියා පිළිවෙළක් හඳුන්වා දීම හා ඒ පිළිබඳ ව නිසි දැනුම බෙදා දීම හා බලශක්තිය හානි වීම අවම විදුලි පහන් වල මිල සාමාන්‍ය ජනතාවට දැරීමට හැකි ලෙස පවත්වා ගෙන යාමටත් බලශක්තිය ආරක්ෂා කර ගැනීමටත් ඉතා වැදගත් ය.
- නිවාස වල පිහිටීම/ සැලැස්ම නිසා බලශක්තිය විදුලිය අපතේ යාම සිදු වෙයි.
- ශ්‍රී ලාංකික ජනතාවට මෙරට දේශගුණය පිහිටීම හා ස්වභාවික සම්පත් වල සැබෑ ප්‍රයෝජනය තවමත් ලබා ගත නොහැකි වී ඇත.

- තිරසර සංවර්ධනය හා බලශක්තිය පිළිබඳ තරුණ ප්‍රජාවගේ උනන්දුව යහපත් මට්ටමක පවතී.
- පරිසර විකල්ප උත්පාදන ක්‍රියාවලි /දිරිගැන්විය යුතු ය.

අනාගත පර්යේෂණ හෝ භාවිතයට නිර්දේශයන්-

- සමීක්ෂණ ක්‍රියාවලියක් සඳහා මෙරට භාවිතා වන ප්‍රධාන භාෂා ත්‍රිත්වය ම භාවිතා කිරීම දත්ත සපයන්නන්ගේ ව්‍යාප්තිය ඉහල යාමට හේතු වෙයි.
- එසේ ම දත්ත ලබා ගැනීම සඳහා දත්ත සපයන්නන් වෙත සැළකිය යුතු කාලයක් ලබා දීම ද වඩා නිරවද්‍ය දත්ත ලබා ගැනීමට පහසුවකි.
- ස්ථානීය සමීක්ෂණයන් ද කළ හැකි නම් ඉතා ඵලදායි ය.
- පෞද්ගලික විස්තර දත්ත වශයෙන් ලබා නොගන්නා විට දත්ත ලබා ගැනීම පහසු ය
- ශීතකරණය මගින් බල ශක්තිය හානි වීම අවම කිරීමට ක්‍රමවේද සෙවීම සහ නිවාස ජලය රත් කිරීම සඳහා විදුලිය වැය නොවන ආකාරයේ පිළියම් පිළිබඳ ගවේෂණය කිරීම.
- බල ශක්තිය තිරසර ව උත්පාදනය කරන/භාවිතා කරන ආයතන වෙත ගොස් නිරීක්ෂණයන් සිදු කිරීම හා එම ආයතන සමඟ එක් ව විශේෂඥ දැනුම ලබා ගැනීම හා මෙවැනි ම සමීක්ෂණ ක්‍රියාකාරකම් මගින් එම දැනුම සමාජගත කිරීම.

ඇමුණුම්

අප පර්යේෂණයට / සමීක්ෂණයට දත්ත සැපයූ සමීපතමයන්ගෙන් ඔවුන්, එදිනෙදා ජීවිතයේ දකින බල ශක්තිය, අපතේ යන හෝ අධික ව වැය වන අවස්ථා ඡායාරූප ගත කර එවන ලෙස අප කළ ඉල්ලීමට අනුව, අප වෙත ලැබුණු සහ අප පර්යේෂණ කණ්ඩායමේ සාමාජිකයන් විසින් විවිධ මූලාශ්‍ර ඇසුරෙන් සපයා ගන්නා ලද එවැනි ම ආකාරයේ හෝ මෙම පර්යේෂණයට/ සමීක්ෂණයට අදාළ විවිධ ඡායාරූප කිහිපයක් අප ඇමුණුම් ලෙස ඉදිරිපත් කරමු.

මෙම ඇමුණුම් මඟින් ද අප සමීක්ෂණය/පරීක්ෂණය මඟින් ලැබුණු දත්ත,නිරීක්ෂණ හා නිගමනවල සත්‍යතාව තහවුරු වෙයි.

ස්වභාවික මූලාශ්‍ර මඟින් බල ශක්තිය නිපදවන පරිසර හිතකාමී අවස්ථා...

1)වික්ටෝරියා ජල විදුලි බලාගාරය

2)මන්නාරම් සුළං බලාගාරය(අන්තර්ජාලය ඇසුරින්)

3)උදම් රළ බලාගාරයක්(අන්තර්ජාලය ඇසුරෙන්)

බල ශක්තිය අපතේ යන අවස්ථා....

4)අනවශ්‍ය කාලවල දැල්වෙන වීදිවල විදුලි පහන්

5)කාලීන නොවන සූත්‍රිකා බල්බ භාවිතය

5) කාලීන නොවන ජල තාපක භාවිතය

6)විදුලි කේතලය බහුල ව භාවිතා කිරීම

7) සැළකිය යුතු ආලෝකයක් නොලැබෙන නිසා හෝ ස්වාභාවික ආලෝකය නිසි පරිදි නිවස තුළට නොගන්නා නිසා(ජනේල විවෘත නොකිරීම) දහවල් කාලයේ ද නිවාසවල විදුලි බල්බ දැල්වීම.

8)ජල කරාම නිසි ලෙස නඩත්තු නොකිරීම නිසා සියුම් ව සිදු වන ජලය අපතේ යාම.

9)දිනපතා විදුලි ඉස්ත්‍රික්ක භාවිතය,නිසි නිර්ණායක පිළිනොපැදීම හා ඒවායේ කාලය සමඟ ඇති වන විවිධ ශක්ති හායක තත්ව පිළිබඳ අනවබෝධය

10)දිනපතා රෙදි සෝදන යන්ත්‍ර භාවිතය

11)අධික මාර්ග තදබදය නිසා ඇති වන අනවශ්‍ය ඉන්ධන දහනය

12)නිසි පරිදි සූර්යාලෝකය,වාතාශ්‍රය නිවාසවලට නොලැබෙන පරිදි නිවාස ඉදි කිරීම

13) Hot water shower අනවශ්‍ය භාවිතය

බල ශක්තිය ආරක්ෂා කිරිමට සමාජයේ භාවිත අවස්ථා කිහිපයක්....

14)සූර්ය කෝෂ සවි කළ විදුලි පහන්

15) සූර්ය පැනල භාවිතා කිරීම

16) පාරදෘශ්‍ය සෙවිලි තහඩු වහලයට යෙදීම

නිවාසවලට යෙදිය හැකි,තිරසර ව බල ශක්තිය උත්පාදනය කර ගත හැකි ක්‍රමයක් ලෙස සූර්ය කෝෂ/ සූර්ය පැනල හඳුන්වා දිය හැකි ය. එම නිසා එවැනි ක්‍රියා පිළිවෙතක් අනුගමනය කිරීමට ශ්‍රී ලාංකිකයන්ට වැය කිරීමට සිදු වන මුදල ගැන අපි අන්තර්ජාලය මඟින් විමසීමක් කළෙමු. (මෙහි දී කිසිදු ආයතනක් ප්‍රවර්ධනය හෝ විවේචනය කිරීමට බලාපොරොත්තු නොවෙයි.)







What is the Price of Solar Panel in Sri Lanka?

Solar Panel Price List (2022)	Price in Sri Lanka (LKR)
Solar Panel: **40W 5V 12V Polycrystalline Silicon Solar**	**Rs. 19,408**
Solar Panel: 100W Semi Flexible Mono Crystalline	Rs. 32,000
Solar Panel: 400W Mono Rec	Rs. 34,500
Trina Solar: TSM-270PD05.08 (270W)	Rs. 35,000

මූලාශ්‍ර

https://roar.media/sinhala/news/features/different-power-generation-methods-in-the-world/amp

https://docs.google.com/forms/d/1-KM547VUZUlgLqJEuKpISCZmtQEvQ8tsHT36RKIDOYE/edit#settings

https://www.solitrapower.com/pricing/

https://youtu.be/Rk19biErhho?si=JgIKO1MBEBxlIUUw

https://www.lankadeepa.lk/features/%E0%B7%80%E0%B6%AF%E0%B6%BD%E0%B6%BA-%E0%B6%85%E0%B6%BB%E0%B6%B6%E0%B6%AF%E0%B6%BA%E0%B6%A7-%E0%B7%80%E0%B6%9A%E0%B6%BD%E0%B6%B4-%E0%B6%B6%E0%B6%BD%E0%B7%81%E0%B6%9A%E0%B6%AD-%E0%B6%9A%E0%B6%BB%E0%B6%B8/2-117324

Journal of Research Technology & Engineeringhttps://www.jrte.org › uploadsPDFOcean Energy Potential in Sri Lanka

https://www.google.com/url?q=https://www.jrte.org/wp-content/uploads/2023/04/Ocean-Energy-Potential-in-Sri-Lanka.pdf&sa=U&ved=2ahUKEwj0k43Az_CEAxWicWwGHfJ-BUIQFnoECDcQAQ&usg=AOvVaw06XnDYQt6Mgn1XX4JZ5skK

https://www.eco-business.com/news/sri-lanka-selects-14-sites-for-wave-energy-development/

https://roar.media/sinhala/news/features/different-power-generation-methods-in-the-world/amp

https://youtu.be/Rk19biErhho?si=JgIKO1MBEBxlIUUw

https://images.app.goo.gl/7TMAFs9ZZUC5gpbP9

Ocean-Energy-Potential-in-Sri-Lanka.pdf

https://dinapalagroup.lk/product-tag/solar/

https://www.hayleyssolar.com/

https://www.solitrapower.com/pricing/

පසුවදන

අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් **“හේමමාලා උපහාර”** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබල ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැකවීම ද මෙහි මූලික අරමුණයි.
මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තූති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්
(ව්‍යාපෘති නිර්මාතෘ)